# Tharanga 2023

තරංග ❀ தரங்க ❀ タランガ



# Cover page narratives

## Cover page - Story

Melding Sri Lanka's elephants with Japan's iconic Mount Fujicelebrates the grace and strength of the two countries. Integrating lotus flowers with sakura blossoms symbolizes the shared cultural tapestry. Highlighting the Sri Lankan traditional dancers and Japanese traditional shrines showcase the vibrant and proud history along with each country's spiritual essence.

* Photos in the designs were obtained from the internet.

Cover page and back page conceptualization and design by:

**Uthpala Kaushalya**


**Title:**

Tharanga

**Author:**

SLSAJ Tharanga Editorial Board 2023

**Publisher:**

Sri Lanka Students' Association in Japan (SLSAJ)

http://www.slsaj.com/

Embassy of Sri Lanka, 2-1-54, Takanawa, Minato-ku, Tokyo 108-0074, Japan

**Date:**

2023.12.27



**Editorial Board:**

**Ms.Thishuli Walpola**

**Mr.Lahiru Rupasinghe**

**Mr.Uthpala Kaushalya**

**Mr.Migara Rathnayake**

**Ms.Ishara Opatha**

**Mr.Mayura Arandara**

**Mr.Muditha Dantanarayana**

**Ms.Nilupuli Indrashani**

# தரங்க 2023 Tharanga තරංග タランガ

## Editorial Board



**Thishuli Walpola**
Tokyo Metropolitan University



**Lahiru Rupasinghe**
University of Tokyo



**Uthpala Kaushalya**
Hokkaido University



**Migara Rathnayake**
Tokyo Medical and Dental University



**Ishara Opatha**
Hiroshima University



**Mayura Arandara**
Hiroshima University



**Muditha Dantanarayana**
Tokyo Institute of Technology



**Nilupuli Indrashani**
University of Tokyo

## Executive Committee Members-2023



**President**
Kasun Thalgaskotuwa
The University of Tokyo



**Secretary**
Amanda Perera
National Graduate Institute for Policy Studies



**Treasurer**
Thishuli Walpola
Tokyo Metropolitan University



**Vice President**
Dulip Somirathna
University of Tsukuba



**Assistant Secretary**
Pramodhya Dissanayake
International University of Japan



**Assistant Treasurer**
Kapila Withanage
Yokohama national University



**Editor**
Lahiru Rupasinghe
University of Tokyo

**Patron**
H. E. the Ambassador
The Embassy of Sri Lanka in Japan

**Executive Committee Members**

President
Mr. Kasun Thalgaskotuwa
slsajpres@gmail.com
The University of Tokyo

Secretary
Ms. Amanda Perera
slsajsec@gmail.com
National Graduate Institute for Policy Studies

Treasurer
Ms. Thishuli Walpola
slsajtreasure@gmail.com
Tokyo Metropolitan University

Vice President
Mr. Dulip Somirathna
University of Tsukuba

Assistant Secretary
Mr. Pramodhya Dissanayake
International University of japan

Assistant Treasurer
Mr. Kapila Withanage
Yokohama National University

Editor
Mr. Lahiru Rupasinghe
slsaj.web@gmail.com
The University of Tokyo

**Advisory Members**
President, Sri Lanka Association in Japan
President, Sri Lanka Academic Association in Japan
President, Automobile Exporters Association in Japan
President, Sri Lanka Business Council in Japan
President, Sri Lanka Professionals Association in Japan
Dr. Nympha Jayamanne
Mr. Thunga Randeniya

**Editorial Board**
Ms.Thishuli Walpola
Mr.Lahiru Rupasinghe
Mr.Uthpala Kaushalya
Mr.Migara Rathnayake
Ms.Ishara Opatha
Mr.Mayura Arandara
Mr.Muditha Dantanarayana
Ms.Nilupuli Indrashani

**Acknowledgements**

All the authors who contributed with their creations
Cover Page and back cover design
Mr. Uthpala Kaushalya

We express our sincere gratitude to:

- Mr. Jagath Ramamayake
  (Rama DBK Ltd)
- Mr.Anil Priyantha
  (Nipara Int.Co.Ltd)
  (Yasiku Int.Co.Ltd)

# කතුවැකිය

"දේශසීමා ඉක්මවා යන නිර්මාණශීලිත්වයේ සහ කලාත්මක ප්‍රකාශනයේ සමරුවක් වන අපගේ නවතම 'තරංග 2023' කලා නිර්මාණය ඔබ අතට පත් කරමින් ඔබ ඇමතීමට ලැබීම මාගේ භාග්‍යයක් කොට සළකමි. ජපානයේ ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමයේ සාමාජික සාමාජිකාවන් ඇතුලු අනෙකුත් සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව දායක කරගනිමින් ඔවුන්ගේ කලා හැකියාවන් ඔප්නංවා ගනු පිණිස විවර කළ මහඟු අවස්ථාවක් ලෙසද මෙම නිර්මාණ සංග්‍රහය හඳුන්වාදීමට කැමැත්තෙමි.

තම උපන් දේශයෙන් පිටත සිට තමන්ගේ සිතට දැනෙන ආගන්තුක හැඟීම් යමෙක් පන්හිඳෙන් අකුරු කරමිනුත් තවත් අයෙක් සිතුවම් මවමිනුත් මෙම කලා නිර්මාණ සංග්‍රහය හැඩ කිරීමට ගෙන ඇති උත්සාහය මහත් සේ අගය කරමි. වසරින් වසර නව්‍යකරණය වෙමින් පියවරක් ඉදිරියට තැබීමට දරන ප්‍රයත්නයන් සාර්ථක කරමින් මෙවර 'තරංග' සඟරාව වෙනත්ම නැවුම් ආකෘතියක් ඔස්සේ ඔබට ඉදිරිපත් කිරීමට අපට හැකියාව ලැබුණු බව මහත් ප්‍රීතියෙන් මතක් කොට සිටිමි.

තම හිතෛෂීන්ගෙන් වෙන්ව ඉතා කාර්යබහුල මෙන්ම පීඩාකාරි ජීවිතයක් ගත කරන ජපානයේ වෙසෙන කලා දක්ෂතාවන්ගෙන් පොහොසත් ශිෂ්‍ය ප්‍රජාව, ඒ සියලු කාර්‍යයන් මධ්‍යයේ වුවද මෙම නිර්මාණ අප වෙත ලබා දෙමින් දක්වන විශාල සහයෝගය ඉතා ප්‍රශංසනීය බව මතක් කරමි. ඒ අතරම ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයටත්, අප සංගමය වෙත නිරන්තර සහයෝගය හා මාර්ගෝපදේශන ලබා දෙන ජපානයේ අනෙකුත් ශ්‍රී ලාංකික විවිධ සංගම් වලටත්, අප සඟරාව සඳහා වෙළඳ දැන්වීම් ලබා දෙමින් අරමුදල් වර්ධනය කර ගැනීමට දායකත්වය ලබා දුන් ව්‍යාපාරික ආයතන වලටත්, ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමය වෙනුවෙන් මාගේ හදපිරි කෘතඥතාවය පුදකරමි.

තවද තරංග සඟරාව සංස්කරණයේදී මා හට නන් අයුරින් සහයෝගය ලබා දුන් මාගේ කතෘ මණ්ඩල සාමාජක සාමාජිකාවන්ටත් ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමයේ සභාපති කසුන් තල්ගස්කොටුව මහතාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. අවසාන වශයෙන් මෙවැනි කලා කටයුතු තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අප සංගමයට සුභාශිංසන පළ කරන අතර ලබන්නාවූ 2024 වර්ෂය ඉතා යහපත් වේවායි යන ප්‍රාර්ථනයෙන් තරංග-2023 සඟරාව ඔබ වෙත සාදරයෙන් පිළිගන්වමි"



**තිෂුලි වල්පොල**
සංස්කාරක
තරංග සඟරාව-2023



## E. Rodney M. Perera

**H. E. the Ambassador**
**Embassy of Sri Lanka in Japan**

"I avail myself of this opportunity to extend my sincere felicitations and best wishes to the Sri Lanka Student's Association in Japan (SLSAJ) on the occasion of the publication of 'Tharanga' Magazine. This commendable initiative serves as a distinguished platform for showcasing the diverse talents of Sri Lankan students currently pursuing their higher education in Japan.

The Embassy of Sri Lanka highly commends the dedicated efforts undertaken by the SLSAJ in creating such a valuable outlet for the expression of creativity among Sri Lankan students. This platform not only serves to highlight the intellectual capabilities of the students across various academic disciplines but also fosters divergent thinking, contributing to the holistic development of their personalities.

Recognizing education as a pivotal factor in shaping the intelligence, emotions, and minds of individuals, we acknowledge the significant role played by initiatives such as Tharanga Magazine in nurturing the creative and imaginative faculties of students. Such endeavors undoubtedly contribute to the cultivation of a generation that is not only well-educated but also capable of becoming productive and innovative contributors to society.

In the year 2024, Sri Lanka commemorates the 72nd anniversary of the establishment of bilateral relations with Japan. The Embassy has been actively engaged in organizing various events in collaboration with the SLSAJ to promote Sri Lankan culture and strengthen cultural ties with Japan. Given the burgeoning student community in Japan, the Embassy anticipates and encourages the initiation of further activities to bolster the longstanding ties between the two nations.

Once again, I extend heartfelt congratulations to the SLSAJ for their laudable efforts in publishing the Tharanga Magazine. I express my sincere wishes for the continued success of the members of the Sri Lanka Student's Association in all their future endeavors."



## Kasun Thalgaskotuwa

**President**

**Sri Lanka Students' Association in Japan**

"I am genuinely delighted to write a message to Tharanga (තරංග, தரங்க, タランガ) 2023, the annual creative publication of the Sri Lanka Students' Association in Japan, representing all the members as well as honorary members and well-wishers of SLSAJ. The achievement of this publication is attributable to the tireless dedication and hard work of the exceptionally talented individuals who invested their valuable time and effort. It has been nearly 33 years since the first release of the Tharanga publication. At this moment, I would like to reflect on and acknowledge all the past members who have made valuable contributions to Tharanga magazine throughout the years.

As a Sri Lankan association, SLSAJ has been actively engaging in organizing various community events throughout the year to uphold and promote Sri Lankan traditions and cultural aspects. Because of the COVID-19 pandemic, physical events have faced limitations over the past three years. Nevertheless, 2023 has turned out to be a busy year for SLSAJ, featuring numerous physical events. SLSAJ is primarily engaged in key traditional, Religious, and cultural activities such as the "New Year Festival", "Thaipongal" and "Annual Alms Giving". Further, as SLSAJ, we host an annual research conference and publish the SLSAJ Academic Journal to enhance the academic standing of graduate students and researchers who contribute to the creation and dissemination of new knowledge. Furthermore, the SLSAJ Annual Trip has been a central gathering point for fostering relationships within the Sri Lankan community in Japan. After a considerable hiatus, the 'Padura 2023' musical event was meticulously orchestrated to offer a unique form of entertainment.

Alongside the commitment of its exceptionally talented members, the support and guidance that the SLSAJ receives from various sources have consistently played a vital role in its sustained success. On behalf of all the SLSAJ members, I would like to extend my sincere gratitude to Mr. E. Rodney M. Perera, His Excellency the Ambassador, Embassy of Sri Lanka in Japan, Ms. Sesath Thambugala, Minister/Deputy Chief of Mission, Ms. Achini Perera, Minister – Counselor and all the members of staff of Sri Lankan Embassy in Japan for their encouragement and tremendous support given to us. Further, we would like to convey our gratefulness to all the well-wishers and honorary members of SLSAJ, all other Sri Lankan associations in Japan, and the Sri Lankan community in Japan for their immense support. Especially on this occasion, I wish to express my gratitude to all those who contributed their creative works to our magazine 'Tharanga 2023'.

Finally, we would like to express our gratitude to the members of the 'Tharanga 2023 committee' for their dedication and commitment to ensuring the success of this endeavor"

# පෙළගැස්ම


| | |
|---|---|
| Editorial Board | ii |
| Executive Committee Members-2023 | ii |
| SLSAJ Committee | iii |
| කතුවැකිය | iv |
| Message from H E the Ambassador | v |
| Message from SLSAJ President | vi |
| පෙළගැස්ම | vii |
| ආවර්ජනා | viii |
| සංහිඳ | 1 |
| සිත් රූ | 13 |
| Interview with Prof. Jay Rajasekara | 20 |
| සේයා රූ | 27 |
| කැටපත් පවුර | 34 |
| මියුරු ගී | 43 |

# ආවර්ජනා 2023

## 14th January 2023-Thai Pongal festival









## 04th February 2023- Independence Day Celebrations 2023







## 4th March 2023-The fifth Annual Plenary Meeting -JASSO










## 25th March 2023- "Padura"














## 21st March 2023-GROW YOUR WEALTH -Webinar with Bank of Ceylon







## 16th April 2023 - New Year Festival













**18th June 2023- "Let's Learn about the disasters and disasters prevention in Japan and world"- joint event organized by Tokyo Fire Department and JASSO**






**11th June 2023- POSON event**







## 30th July 2023- A webinar on study opportunities in Japan







## 22nd October 2023- Professional guidance for Sri Lankan students pursuing education in japan






**30th July 2023- Katina Pinkama**






**18 & 19th November 2023- Annual Trip**











## 10th December 2023- Motivational programme on Mental Health





## 23rd December 2023- SLSAJ Annual Research Conference 2023










# සංහිඳ



# මරණී

**දු**ම්රිය එන තුරු මා සිටි නොඉවසිල්ල කෙමෙන් කෝපයකට හැරෙමින් පැවතින. මේ වන විට දෙවතාවක්ම දුම්රිය ප්‍රමාද බව නිවේදනය වී තිබිණි. "මට බස් එකේ යන්නයි තිබ්බෙ...." මා මට ම බැනගන්නට වීමි. දැන් දුම්රිය පොළ නිහඬය ඒක හරියට මළගෙයක් වගෙයි......මගේ මතකය හරියටම නැවතුණු තැන තීරණය කරන්නටත් පෙර දිග සුසුමක් ඇදී ඇවිත් පපුව පිරී ගියේය. පාන්දර **4**ට විතර පේරාදෙණියෙ තියන හුළඟ සීතයි. ඒ නිසාම ඇද ගත් හුස්ම අපහසුවක් ජනිත කරන්නට සමත් විය.

මරණී ඔහුට එන්න කියා පණිවිඩයක් එවා තිබුණි, ඒ ඇයි? එදා වගේම මම අදටත් ඒකට හේතුවක් දන්නෙ නෑ. එදා උදේ මරණීව හමු වූවාට පසු ඌ උගෙ හොදම යහලුවාට වත් කතා කරල තිබ්බෙ නෑ. මරණී ආදරෙයි කියල තිබුනා නම් උගෙන් පාටියක් ගලවන්න තිබ්බා. මරණී කියන්නෙ තමන්ට ඕන වෙලාවට ඇවිත් තමන්ට ඕන වෙලාවට ආපසු යන කෙනෙක් කියලා අපි හැමෝම හොදටම දැනගෙන හිටියා. ඒත් ඒක ඒ වෙලාවෙ උට කියුවත් ඌට ඒක ඇහෙන්නෙ නෑ ඒ නිසා අපි ඒක කියන්න ගියේ නෑ. කෙල්ලො නිසා කොල්ලො වෙනස් වෙනවා හැබැයි එච්චර ඉක්මනට වෙයි කියල හිතන්න අමාරුයි. කොටින්ම කියුවොත් ඌ එච්චර ආදරේ කරපු ගිටාර් එකවත් අරන් ගියේ නෑ.

මට දැන් හිතෙනවා ඔච්චර ඉක්මනට වශී වෙන්න මරණී ගොඩක් ලස්සන ඇති. මම මරණීව තාම ලගට දැකල නෑ. මම කොච්චරක් වෙලා රේල් පාර දිහා බලාගෙන හිටියද කියන්න අමාරුයි. "යන්තම් ඇති.... දැන්වත් එනවා........" දුම්රියේ ඡායා මාත්‍රය දැකීමෙන් සැනසුම් සුසුමක් හෙලීමි. දුම්රියේ වේගය වැඩි නිසා මම පියවරක් පස්සට තැබුවෙමි. මා සිටි තැන පසු කර ගොස් දුම්රිය නතර වීය. මම නැගගත්තේ පසු පසම මැදිරියට ය.

දකුණු පස කවුලුවක් අසල වාඩි වුනු මා වීදුරුවේ බැදී තිබූ මීදුම පිස දැමුවෙමි. ඒ සමගම ගැස්සුනු දුම්රිය පසු පසට ධාවනය වන්නට විය. මගේ සිතින් මැකී යමින් තිබූ කොපය දැල්වී ගියේ ය. අන්තිම පෙට්ටිය පාලමත් පසු කරන්නට වූ නිසා ඒදා මෙදා තුර රට පාලනය කරවුවන් සිහි කරන්නට වීමි. මිනිත්තු කිහිපයක් නවතා තිබූ දුම්රිය යලි ධාවනය වන්නට විය.



පාළම පසුකර යන විටදී මට තරුණියන් දෙදෙනෙක් දකින්නට ලැබුණි. එක් අයෙක් මා කලින් කොහෙදින් හෝ දැක තිබේ. දුම්රිය ඔවුන් පසුකර ඇදී යන්නට විය. මා හැකිතාක් ගෙල හරවා ඔවුන් දෙස බලා සිටියෙමි. දැන් ඔවුන් පෙනෙන්නේ නැත. මා යලි හිස හරවා ගතිමි. ඒත් ඇය කවුද? .........ඒ මරණී වත්ද?.........මට එකවරම සිතුනි, මා නැවතත් හැරී බැලුවෙමි. එහෙත් ඇය දැන් නොපෙනේ. දුම්රිය දිගටම ඇදී යයි.

*Migara Rathnayaka*
*Tokyo Medical and Dental University*

# 来日して初めて感じたカルチャーショック

スリランカ出身だった私が 2012 年に国費留学生として初めて日本にきました。日本のことが好きだったので留学前から日本文化、マナー、料理などについて調べたことがあったが、それでもカルチャーショック受けるんだと思うぐらいショックを受けたものがあったので、それについて紹介させてください。

まず、ショックだったのが日本の電車ですね。ここは図書館なの？と思うぐらい電車が静かすぎてびっくりしました。それに、電車に乗っている間は携帯もマナーモードに設定しますね。そこまでまわりのことを配慮するんだなと思いました。スリランカと違いすぎてびっくりしたもう一点は、電車が来るまで皆さんが綺麗に列に並んで待っていることです。電車がホームに到着したら、降りる人を通してあげて列に並んだ順に綺麗に電車に乗っていく姿にびっくりしました。この乗り方は効率良くてスリランカにもあって欲しいです。

次に、日本の町事情でショックした点について紹介します。日本はどこへ行っても綺麗な町が多いですね。なのに、ゴミ箱あまり見かけません。ゴミ箱あまりないのに、何でこんなに綺麗なの？誰か定期的に掃除しているの？いいえ、そうではなっかた。良く見ると、皆さん自分のゴミを持ち帰っていきます。偉いですね。そしてもう一点は、日本の車はあまりクラクションを鳴らさないことです。スリランカはよくクラクション鳴すので、日本の道路上の静かさにもショックしました



私がショックしたもう一点が日本のトイレです。どこへ行っても清潔なトイレが無料で使えることと、ヴォシュレットの機能が優れていることにショックしました。トイレが現代的すぎて時々何を押せばいいか戸惑うこともありますが、全体的日本のトイレは世界一だと思います。

日本に来てはじめてショックだったことが他にもたくさんありますが、今回はこれぐらいにしておきます。日本に住みはじめて 5～6 年経つ今でもカルチャーショックを感じることはゼロではないです。

*Nushani Chamanthi de Silva*

# නිසල අඹර

උදෑසන සිට රාත්‍රිය ගෙවී අලුයම උදා වුවත් නුවර කොළඹ මාර්ගයට නිනව්වක් නැත. විනාඩි පහකට හෝ වතාවක් පාලු කපමින් වාහනයක් ප්‍රධාන මාර්ගයේ ධාවනය වෙයි. ප්‍රධාන පාරේ සිට නිවෙස් කීපයක් පිටුපසින් ඇත්තේ "මහානාම&මේබලා සෙනෙවිරත්න" යන්නෙන් තාප්පය මත නම් දැරූ ශ්වේත අලේපිත මහල් දෙකකින් යුත් නවීන පන්නයේ නිවසකි.

අලුයම දෙකේ කනිසම පසු වී මිනිත්තු කීපයක් ගිය තැන ගැස්සී ඈ නැගිට සිටියේ දහඩියෙන් පෙඟී ගිය වතිනි. ඇදට අපහසුවෙන් හේත්තු වූ ඈ දුටුවේ තමා පසෙක තද නින්දක පසුවන මවයි. අධිකව රිදුම්දෙන හිස දෙපසින් තද කරමින් ඇය මතක් කලේ තමා දුටු භයන්කර සිහිනයයි. සිහිනයෙන් වුවද ඔහුට එවන් විපතක් සිදුවනවා සිතීමද ඇයට බිය ජනකය. එතරම් ඉඩක් ඇය සිත තුල ඔහු වෙනුවෙන් ඈ නොඅඩුව දරා සිටියා.

වේගයෙන් වැටෙන හුස්ම ඈ අයාසයෙන් පාලනය කරගනිමින් සීරුවෙන් තම මව අවදි නොවන්නට ඇඳෙන් නැගී සිටියේ වේදනා නාශක පෙති දෙකක් සොයා ගැනුමටයි. හදිසියේවත් තම මව නැගී සිටියහොත් තමා ගැන ඕනෑවටත් වඩා කලබල වන බව ඈ දැනන් උන් හෙයින් සීරුවෙන් වේදනා නාශකපෙති දෙක ගිල දමා නැවත යහනට ගොඩ උනේ හෙට දින උදෑසන උසස් පෙළ අමතර පන්තියට යෑමට පෙර පැය කිහිපයක හෝ නින්දක් ලබා ගැනුමට සිතාගෙනයි.

උදෑසන තදට ඇලවී තිබූ දෑස් අපහසුවෙන් ඇර ගත් ඈ බැලුවේ බිත්තියේ සටහන් වෙලාව දෙසයි.


"දෙයියනේ..6.30 යි.. අම්මා..."
"ඈ..ඇයි සුදූ...?" බියපත් කටහඬින් මේබලා විමසා සිටියා.

"අනේ..6.30ත් වෙලා ඔයා මාව නැගිට්ටුවේ නැත්තේ ඇයි..ක්ලාස් යන්න පරක්කු වෙනවනේ" බුම්මාගත් වතින් ඈ තම මව දෙස බැලුම් හෙලුවා.

"සුදූ.. මං බය උනා ලමයෝ කෑ ගහපු පාරට.. ඇත්තමයි මගෙ ඇගේ ලේ අඩු වෙන්නේ කවදාහරි වතුර වෙලා.. එක්කෝ මාව බය කරනවා නැත්තන් තරහ ගස්සනවා.. කලින් සති දෙකේම ක්ලාස් තිබ්බෙ නැනේ.. ඒ නිසා මං ඔයාට කතා කලේ නෑ.."

"අයියෝ අනේ.. අම්මා ඔයාගෙ ෆෝන් එක දෙන්නකෝ මං නිශූගෙන් අහන්න අද ක්ලාස් තියෙනවද කියලා.."
ඈ වෙත තම ෆෝනය දිගු කල මේබලා අසලම සිටිමින් දියණියගේ වත දෙස පරික්ෂාකාරීව බලා සිටියා.
මේබලාද රාජකාරි කලේ තම දියනියන් දෙදෙනා ඉගැනුම ලබන පාසලේමය.

කුඩා කල පටන් දැඩි රැකවරණ මධ්‍යයේ හැදූ දියණියන් දෙදෙනා 19 වියේ හා 13 වියේ පසු වූහ.දියණියන් දෙදෙනාටම තම යහලුවන්ට කතා කිරීම සඳහා තිබුනේ මවගේත් පියාගේත් දූරකතනය හෝ නිවසේ ස්ථාවර දූරකතනයත් පමනි. විශ්ව විද්‍යාලයට යනතුරු තම දරුවන් දූරකතනයක් භාවිතා කිරීම ගැන මහානාම හෝ මේබලා කැමත්තක් දැක්වූයේ නැත.



"හෙලෝ නිශූ.. මේ..අද ක්ලාස් තියෙනවද?"
"මන්දාකිනි.. ඔයා එන ගමංද?" නිශාරා විමසා සිටියා.
"නෑ ඕයි අද ක්ලාස් තියෙනවද අහන්න ගත්තේ.."
"අනේ බූරු දෙන ගෲප් එකේ මැසේජ් එකක් දාල තිබ්බෙ.. අම්මා කිව්වෙ නැද්ද?"
"අම්මට වට්සැප් බලන්න බැරි වෙන්නැති..මට නැගිට්ද්දි ලේට් උනා අද.. ඊයෙ රෑ ඔලුවෙ කැක්කුමක් අල්ලලා.."
"එතකොට එන්නේ නැද්ද ඔයා අද.." නිරාශා කටහඬ බෙරි කර ගනිමින් අසා සිටියා.
"නෑ නෑ මං එනවා.. මම දැනටමත් ලේට්.. මට තැනක් තියා ගන්න.. ක්ලාස් එකේදී මීට් වෙමු..බායි බායි.."

පියා සමග මෝටර් රථයේ යන ගමනේදී ඈ හට සිහි වූයේ පෙරදින රාත්‍රියේ දුටු සිහිනයයි. එය නැවත සිහි කිරීමට පවා ඇය බිය වූවා. මදක් හෝ සිත නිවා ගන්නට හැකි වූයේ අද ඔහුගේ හමුව මතක් වීමෙනි.

" ඇ ඇයි තාත්ති?"

"මම ඔයාට කීප සැරයක් කතා කරාද.. නයා නැති උන අභිකුන්ටකයා වගේ මූඩ් ගහල.."

"අයියෝ නෑ තාත්ති.. මම මේ ලේට් වෙලා නිසා බය උනේ.. ඇතුලට යන්නත් මිෂන් එකක් කරන්න වෙයිද කියලා.. අම්මිගෙ අනික් පොඩි ෆෝන් එක මට අද දුන්නා.. තාත්ති නංගිවත් අරන් එද්දි කෝල් එකක් දෙන්න.. මම වෙනදා තැන් දෙකෙන් එකක ඉන්නන්.. මං ගියා එහෙනන්.."

වැව රවුම ඉහත්තාවේ මාර්ගයේ කෙලවර වූ අමතර පන්තිය වෙත මන්දාකිනි යශෝරා පිය නැගුවේ කඩිනමිනි. ඈ යන විටත් සිතූ පරිදිම පන්තිය අරඹා විනාඩි 15ක් පමණ ගත වී තිබුනි. තැනින් තැන සිසුන්ගේ දුක්මුසු සුසුම් ඇසුනත් මන්දාකිනි ඒවා මායිම් නොකොට නිශු සොයා වැඩි ශබ්දයක් නොනැගෙන පරිදි ගියේ පන්තියට බාධාවක් නොවන්නටයි..

"මොකද නිශූ මේ කට්ටිය සෝක මූඩ් අද..?"

"න්..නෑ බන් සර් ක්ලාස් කලේ නැනේ මේ වූ වීක්ස් වල.."

"ඉතින්…"

"සර්ගෙ පුතා ඇක්සිඩන්ට් වෙලා..icuලු ඉන්නේ දැන්.."

"නෑ.."

"නෑ නෙවේ ඔව් බන්.. පව්.. සර් අපෙ exam එකට තව මාස තුනක් නිසා කොහොම හරි මේ ටිකේ එනවා කිව්වා.."

"පව් නේ.. සර් සැහෙන්න අවුලෙන් ඇත්තේ.."

"හ්ම්ම්.. මොනා කරන්නද බං.. ළමයි එන්න ඇහුවා සර්ගෙ පුතාව බලන්න, ඒත් icuඉන්න නිසා තේරුමක් නෑ කියලා කිව්වා.. සර්ට කරන ලොකුම උදව්ව අපි හරියට exam කරගන්න එක කිව්වා.."

ඇගේ හිත මොහොතකට ගැස්සී ගියේ ඔහුත් මෙහි අමතර පංති කරන්නා වූ ගුරුවරයෙකුගේ පුතෙකු බැව් ඈ දැන සිටි නිසාවෙනි. යසස් මේසන, ඔහු කිසි දිනෙක තම වාසගම හෝ පියා පිලිබඳව ඈ හට නොපැවසීමට හේතුව ලෙස කියා සිටියේ එය දැන ගතහොත් ඇයට මෙහි පවත්වන පංති සඳහා සහභාගී වීමට සිතේ නිදහස නැති වේ යැයි පවසමිනි.

ඉදින් ඔහුගේ සිතුම් පැතුම් රටාවන්ද වෙනස්ය. ඔහු බොලඳ නොවූ වගකීම් වලින් යුක්තව ජීවිතය දෙස බලන ආකාරයට ඈ ප්‍රිය කලා.

"දෙයියනේ මේස.. එයාවත්ද මේ සර්ගෙ පුතා කියන්නේ.. අනේ එහෙම නං හීනෙකින්වත් වෙන්න එපා.." හැඩුම් සිතින් යුතුව ඈ මිමිනුවා.

"මොකෝ බං උනේ එක පාරට මනෝ ගහලා.." නිරාශා මන්දාකිනි දෙස බලා විමසා සිටියා.

"අනේ නිශූ.. මම ඊයේ මේස අයියව හීනෙන් දැක්කනේ.. එයාද මේ කියලා මම බය උනේ.."

"ඔව් ඉතින් උබට හීනෙන් පේන්නත් එපැයි, සති දෙකකින් දැකලා නැනෙ.. උඹෙ සත්‍ය ප්‍රේම රාජයා නෙවෙයි වෙන්නැති බං.. එයා හෙන රෙස්පොන්සිබල් කෙනෙක්නේ.. අනික අද හවසට මීට් වෙයිනේ" හීනියට සිනාසූ නිෂාරා පවසා සිටියා.

"අනේ එයා මට සතියක විතර ඉඳන් මැසේජ් එකක්වත් දැම්මේ නෑ නිශූ.. මට බයත් හිතුනා.."

"අනේ මන්දාකිනි මේ.. උබට හරි හමං ෆෝන් එකක්වත් නැනේ.. අම්මා ගාව තියෙන ෆෝන් එකක්නේ ක්ලාස් එද්දි ගේන්නෙත්.. ඉතින් ඒ මනුස්සයා කොහොමද කියනවකො කතා කරන්නේ ඔයා ගෙදර ඉද්දි.."

"හ්ම්.. ඒකත් ඇත්ත.. ඒත් මං ඊයේ නරක හීනයක් දැක්ක නිසා හිතට බයයි .."

"සමයං නැතුව ඉන්නවා.. ඔය සාන්කාව.. අද හම්බෙයිනේ උඹෙ ප්‍රේම කුරුල්ලව.. එතකොට ඕක හරි යයි.. ඇත්තට බං මාත් හරියට දැකලා නැනේ තාම.. පිටිපස්සෙන් එදා දැක්ක ටික විතරනේ.."

“එයා ප්‍රේම කුරුල්ලා නෙවෙයි මගේ.. එහෙම ආස්කවුට් කරලා නෑ මගෙන් කවදාවත්.. අනික ඔයාට හැමදාම කලබලේනෙ ක්ලාස් එක ඉවර උන ගමං යන්න.. මාත් එක්ක තව විනඩි15 හිටියනන් මීට් වෙන්න තිබ්බා.. එයා හැමදාම තාත්තට කෑම එක දීල එද්දි ඒ ටයිම් එක වෙනවා..” රත් පැහැ ගැන්වූ වතින් යුතුව බිම බලමින් ඇය පවසුවාය.

“මට ඉන්න බෑනෙ බං ගුඩ් ෂෙඩ් එකට වෙලාවට යන්න ඕනේ බස් එක අල්ල ගන්න.. යන්තන් ක්ලාස් එක 1ට ඇරපු ගමන් දුවන්න ඕනෙ නැත්තන් ආයි ස්කූල් ටයිම් අහු වෙනවනේ.. අනික.. උඹෙන් ආයි කැමැත්ත අහන්න දෙයක් තියෙනවද බං.. ඌ අහන පමාවට උඹ හාක්.. කියන්නනෙ ඉන්නෙ.. ඔන්න බලපන් අච්චර ටාස්ක් ෆෝස් එකක් මැද හදන උබටත් එකෙක් ඉන්නවා.. මෙච්චර නිදහස් මට එකෙක්ටවත් හිත යන්නෑනේ.. මං වගේ රන් කඳකට කර ගහන්න එකෙක්ටවත් පිනක් නෑ ඉතින්..”

ඉතින් ඇය එසේයි.. නැව ගිලුනත් බෑන් වුන් කියා සතුටින් ඉන්නා තම මිතුරිය දෙස බලා දුක මදකට පසෙකට කර අපහසුවෙන් වුවත් ඇ පාඩමට අවධානය යොමු කලා.

පන්තිය හමාර වූ සැනින් නිශාරා, මන්දාකිනි කැටුව වැව රවුමේ පිහිටි බස් නැවතුම්පල වෙත කඩිනමින් පැමිනියේ බසයකට නැගීමටයි. නිශාරාට සමු දී මන්දාකිනි වැවරවුමේ වූ ඇයට හුරු පුරුදු බංකු පෙල වෙත ඇවිද ගියේ ඔහු දැකීමේ බලාපොරොත්තු දල්වාගෙනයි. ඇගේ පියා මහානාම තම ව්‍යාපාර වෙනුවෙන් අධිකව වෙහෙසුනත් කිසි දිනක ඇය හෝ සොහොයුරියගේ වැඩ මග හැරියේ නැත. නැගනියගේ පාසල නිමා වී ඈ ද රැගෙන එද්දි පස්වරු 2ට ආසන්න වූවත් නිතරම මාලිගාව වන්දනාමාන කරමින් හෝ අනෙක් පස වූ මාලුන්ට කෑම දමමින් නිදහසේ සිටීමට මන්දාකිනි ප්‍රිය වූවා. ඉදින් ඔහු මුන ගැසුනේද එවැනි දිනකයි.

මාලිගාවට යාමට ප්‍රථමව ඇ මාලුන්ට කෑම දාන්නට නියමිත වූ ඉසව්වේ සුපුරුදු බංකුවේ රැඳී සිටියේ ඔහුගේ පැමිනීම බලාපොරොත්තුවෙනි. සිත නොසන්සුන්ය, වෙනදාට ඔහු පැමිනෙන වේලාවද පසු වෙන විට ඇ සිත පිරී ගියේ අමුතුම බියකිනි.

“මේඝ.. ඔයා ආවෙ නැති උනොත් මම කොහොමද විස්තරයක්වත් හොයා ගන්නේ.. කාගෙන් කියල මොනවා අහන්නද.. ඔයාගෙ ෆෝන් එකත් ඕෆ්.. දෙයියනේ මගෙ ඔලුව විකාර වෙනවා..”
සිතට එන නොයෙක් දෑ සමග අරගල කරමින් සිටි ඇයට වට පිටාව ගැන වගක් නොවුනි.

“යශෝ..” ඉදින් ඇගේ දැහැන බිදි ගොයේ ඔහුගේ පුරුදු සන්සුන් කටහඩිනි..

කඳුලු පිරි දෙනෙතින් තම අනෙක් පස හැරුනු මන්දාකිනි දුටුවේ ඔහුගේ රුවයි. ඔව්, අනෙක් සෑම අයෙක්ම මන්දාකිනි යන්නෙන් ඇමතුවත් ඔහුට ඇය යශෝ විය. විටක ආදරණීයව සුදූ කියා අමතන්නටද බැරෑරුම් වූ විටෙක තම පියා මෙන් දරුවෝ යයි කියන්නටත් ඔහු හුරුව සිටියේය. ඉදින් ඇද ඔහු ඇමතුවේ ඔහුගේ දෙවැනි නම වූ මේඝ යන නමිනි.
“මොකද සුදූ මේ.. ඇයි කඳුලු? මම එන එකක් නෑ කියල හිතුවද?”

“අනේ මම බය උනා.. අද ක්ලාස් එකේදි ලමයි කතා උනා සර්ගෙ පුතා ඇක්සිඩන්ට් වෙලා කියලා මම ඔයාද කියලා බයෙන් හිටියේ.. ඔයාගෙ ෆෝන් එකත් ඕෆ්.. මට හිතා ගන්න බැරුව හිටියේ මුකුත්..”

“සුදූ ඔයා දන්නවද මං කොහෙ යන්න උනත් ඔයාට කියලා යන්නේ කියලා.. ඉතින් ඒ විශ්වාසෙන් ඉන්න.. මං එහෙම ආවට ගියාට පොරොන්දු දෙන කෙනෙක් නෙවෙයි කියලා ඔයා දන්නවනේ” තරවටුවක සේයාවෙන් ඔහු පවසා සිටියේය. ඉදින් ඇයට එපමනක් සෑහේ.

“නිශූ ඔයාව දැකලා නෑ කියල අදත් නාහෙන් ඇඩුවා..” නැවතත් පෙර ලෙස ඔහු හා දොඩමලු වෙමින් ඇ කියා සිටියාය.

“එයා ඉතින් රේස් යනකොට බස් අල්ලන්න, මාව බලන්න වෙන එකක් නෑ”
“මාත් ඔය ටිකම කිව්වා.. ඔයා අදත් කෑම දීලද ආවෙ සර්ට?”
“ඔව් අද ටිකක් ලේට් උනා.. මගෙ තාත්තව දන්නෙත් නෑ.. හැබැයි සර් කියල නේ කතා කරන්නෙ මාමණ්ඩිට..”
“ඉතින් අනේ එයා සර් කෙනෙක්නේ.. ඕන කාලෙට ආමන්ත්‍රනය වෙනස් කරන්නන්..” ඔහු වෙත ඇද කරමින් ඇ පැවසුවාය

"සුදූ.." බැඳිරුම් වතින් ඇ දෙස ඔහු හැරුන අයුරින් ඔහු මේ සැරසෙන්නේ ඇයට දේශනයක් දීමට බව ඇයට තේරුනි.

"අනේ අයියේ අද නන් ලෙක්චර්ස් එපා.. මම ඇති වෙන්න අම්මගෙනුයි තාත්තගෙනුයි ලෙක්චර්ස් අහනව මේ ටිකේ.. ඔයා exam ඉවර වෙලත් තේරෙන්නැද්ද අනේ අන්තිම මාස තුනේ ලෙක්චර්ස් අහන්න උනාම එපා වෙනවා කියලා.." බෙරි කරගත් මුහුණෙන් ඇ කියා සිටියාය.

"දරුවෝ.. මම ඔක්කොම ඉවර කරපු නිසා තමයි මේ කියන්නේ.. හැමදේම පිලිවලට කරන්නේ මම ඉස්සර ඉඳන් මගෙ ජීවිතේ ප්ලෑන් කරපු නිසා.. හරි හමං ඉලක්කයක් නැති මිනිහෙක් කියන්නෙ ඔහේ විදපු ඊතලයක් වගේ.. කොහෙ වැදෙනවද දන්නෑ.. හැබැයි ෆෝකස් එකක් ඇතුව විද්දොත් ඊතලය යන තැන දන්නවා.. අම්මල උනත් ඔයා ගැන ලොකු බලාපොරොත්තු තියාගෙන ඉන්නේ.. මොකද හැම දෙමව්පියෙක්ම කැමති තමන්ගේ දරුවා ඉහලට යනවා බලන්න.. මම දන්නවා ඔයා ලොකුවට පාස් උනේ නැතත්, ඔයාගේ තාත්තා ඔයාව ප්‍රයිවට් යුනි එකකට දායි.. ඒත් පොඩ්ඩක් හිතන්න ඒ වෙනුවෙන් තාත්ත සල්ලි හොයන්න තව කොච්චර වෙහෙසන්න ඕනෙද කියලා.. හැම වෙලාවෙම අපෙ දෙමව්පියෝ අපි වෙනුවෙන් කරන කැප කිරීම් මතක තියාගෙන ඒකට වටිනා කමක් දෙන්න ඕනෙ.. මගෙ සර් කෙනෙක් ඉස්සර කියනව.. මෙච්චර කාලයක් අම්මලා තාත්තලා අපි වෙනුවෙන් කරපු ඒවට ණය ගෙවන්න හොදම විදිහ තමයි කියල එයාලා වෙනුවෙන් මහන්සි වෙලා ඉගෙනගෙන හොද උපාධියක් ගන්න එක කියලා.. අපිට ඒ ගමන වැදගත් සුදූ.. අනික මේ මාස ටිකේ ගෙදර ඉද්දි මං මැසේජ් කරයිද කියල බලන් ඉන්නත් එපා.. වැඩ වලට ෆෝකස් කරන්න.. අපි පුරුදු වෙලාවට පුරුදු දවස් වලටම මෙතනදි මීට් වෙමු.. හොදද.."

"හ්ම්ම්ම්.. තේරෙනවා අයියේ.. මං විහිලු කරන් හිනා වෙලා හිටියට ඒ ගෝල් එක ඇතැරල නෑ.. අම්මල වෙනුවෙන්, ඔයා වෙනුවෙන් මම ඒක කොහොම හරි කරන්නන්.. අනික මට කැම්පස් එන්න බැරි උනොත් කොහෙවත් යන කෙල්ලෙක් ඇවිත් ඔයාගෙ එල්ලෙයි, එහෙම වෙන්න දෙනවද මං.."

"නට් ලූස් කියන්නේ මේ කෙල්ලට මම නිකන්ද ඉතින්.. යමු තාත්ත එනකන් මාලිගාවට ගිහින් වැදලා එමු.. ඔයා නිසා පින් එකතු කරගන්නවා මං" සිනා සී පැවසූ ඔහු බංකුවෙන් නැගී සිට මාලිගාවෙ ප්‍රධාන දොරටුව වෙත හැරුනි.

ඉදින් මෙලෙසින් මාස තුනක කාලය ගෙවී ගියේ වේගයෙනි. මේසගේ ඇසුර නිසාවෙන් මන්දාකිනි විභාගයට තවත් උනන්දු වූවා මිසක නොමගක ගියේ නැත. විභාගයට පෙර පන්තියේ අවසන් දින නිමවී සියලු දෙනා විසිර ගියේ ඇදුරුතුමන් විසින් දුන් උපදෙස් මල්ලද, වෙන්ව යාමෙ දුකද සමගයි. ඉතින් මන්දාකිනියගේ මුහුණ අඳුරු පැහැ උනේ විභාගය අවසන් වෙන තෙක් ඔහුව නැවතත් මුන ගැසීමට නොහැකි වන නිසාවෙනි.

"මොකද සුදූ මේ මූන සත පහේ කාසියක් වගේ වෙලා,"සුපුරුදු සිනා වතෙන් මේස විමසා සිටියේය.
"ඔයාට ගානක් නැද්ද අනේ තව මාසෙකට විතර අපිට කොහොමවත් මීට් වෙන්න වෙන්නෑ.. කතා කරන්න වෙන්නෙත් නෑ.. මට දුකයි ඉතින්.."
"හරි අහන්නකෝ මම අනිවාර්‍යයෙන් ඔයාට exam එකට කලින් දවසෙ විශ් කරනවා.. අනික් දේ විභාගේ ඉවර උන වීක් එකේ සෙනසුරාදා උදේට මාලිගාවට එන්න.. මං ඔයාව එදාට මීට් වෙන්නන්.."
ඉදින් මන්දාකිනිගේ වත පුන් සඳක් සේ ක්ශනයෙන් වෙනස් වී දිස්නෙ දෙන්නට විය.
"ඒත් ඔයා කොහොමද මාව හොයා ගන්නෙ එදාට කොතනද ඉන්නෙ කියලා.."
"ඒක ලොකු දෙයක් නෙවෙයි.."
ඔහු සිනාවෙන් පවසා සිටියත් දැස කියා සිටියේ වෙනස් කතාවකි. ඇ අසීරුවෙන් ඔහු කියවීමට උත්සහ දැරුවත් මේසයක් සේ වෙනස් විය හැකි ඔහුගේ වත කොහොම කියවන්නද.
"යමු.. අද ගොඩක් වෙලා මාලිගාව වදිමු.. වැල් බෝධියටත් යමු.. මම ගොඩක් වෙලාවට හිත නිදහස් කරගන්නේ එතන.. මෙතනදි මම ඔයාට කරන අශිර්වාදෙත් එක්ක ඔයාට කවදාවත් වරදින එකක් නෑ සුදූ"

"අනේ ඔහොම කතා කරන්නේ ඇයි අප්පා.. මට හරිම වියර්ඩ් ෆීලින්ග් එකක් එන්නේ.. මම කැමති නෑ ඒකට, තව මාසයයිනේ.. විභාගෙට ෆෝකස් කරපුවම ඒ මාසෙ යනවා දැනෙන එකක් නෑ.. හැබැයි ප්‍රොමිස් වෙන්න ඔයා ඉවර උන ගමං තියෙන වීකෙන්ඩ් එකේ සෙනසුරාදා උදේ 8ට එනවා කියලා.."

"ප්‍රොමිස්.." යැයි පවසා ඔහු කට පුරා හිනා වූවේය. ඉදින් ඒ කලාතුරකින් ඔහුගෙන් පිටවන පුලුල් සිනාවෙන් පිරි වත හිතේ හැටියට මන්දාකිනි සටහන් කරගත්තේ පැමිණෙන මාසයටම අමතක නොවන ලෙසයි.

"ලොකු දූ.. මෙන්න නිශූ කතා කරනවා.." මේබලාගේ හඬ මන්දාකිනිට ඇසුනේ පහත මාලයෙනි.
"අහ් නිශූද.."
"ඔව් ඉතින් වෙන කව්ද ලෑන්ඩ් ලයින් එකේ නම්බර් එක දන්නේ.. එන්න පහලට ඉක්මනට.."
"හෙලෝ නිශූ.."
"හම්මේ බං උඹ එක්ටැම් ගේකද ඉන්නේ මෙච්චර වෙලා යන්නේ ආන්සර් කරන්න.."
"අනේ මේ මගෙන් අහ ගන්න එපා මුකුත්.. "
"හ්ම්ම් හ්ම්ම්ම්.. ඊට කලින් අහන්න දෙන්න එකක් තියෙනවා.."
"මොකද්ද.. විකාර වොයිස් රෙකෝඩර්ස් නන් අහන්න දෙන්න එපා අම්මලත් ගෙදර ඉන්නව හරිද මෝඩි.."
"එහෙම එකක් නෙවෙයි ගොනො.. වොයිස් මැසේජ් එකක් අහගෙන ඉදල කියනවකො විකාරයක්ද කියලා.."
"අහ් හරි හරි අප්පේ.. දාන්න දාන්න.."

"සුදූ.." ඉදින් ඒ මන්දාකිනියගේ ආත්මයටම බද්ධ ඔහුගේ කටහඬයි.. දවස තිස්සේ මග බලන් හිටියේ ඔහුගේ සුභ පැතුම එන තෙක්ය.. දැන් ඉතින් හිතේ සතුටින් විභාගයට මුහුන දිය හැක.
"දරුවෝ.. මම දන්නවා දැන් ඔයා හොදට ලෑස්ති වෙලා ඉන්නේ කියලා.. අනික මං විශ්වාස කරනවා අනිවාශ්‍යයෙන් ඔයාට මේක කරන්න පුලුවන් කියලත්.. ඒ කන්ෆිඩන්ස් එකෙන් ගිහින් විභාගෙ හොදට කරන්න.. මගෙ ආශිර්වාදේ හැම වෙලේම ඔයා ලග තියෙනවා.. මගෙ ප්‍රොමිස් එකත් මතකයි මට..පරිස්සමට ඉන්න.. තෙරුවන් සරනයි.."

"හරිනේ.. මගෙ වට්සැප් එකට එවල තිබ්බෙ උඹෙ සත්‍ය ප්‍රේම බෘන්ග රාජයා උඹට අහන්න සලස්සන්න කොහොම හරි අද කියලා.. මං නන් මුකුත් අහන් හිටියේ නෑ ප්ලේ කරල එහාට වෙලා හිටියේ ඔන්න.. ඇත්තට මේ මනුස්සයා මගෙ නම්බර් එක කොහෙන් හොයා ගෙනද මන්දා.. මාත් පුදුම උනා…"
"නිශූ නංගී.. මම යසස්.. ලොකු උදව්වක් විදිහට මේක යශෝට අහන්න දෙන්න අද.. කියලා තියෙද්දි"
"අනේ නිශූ.. ඔයාට පින්.. මං හරි අවුලෙන් හිටියේ.. දැන් නන් ඔක්කොම හරි.. අහ්.. ඔයාට හෙට උදේට විශ් කරන්නන් එහෙනන් ස්කූල් එකේ මීට් උනාම.."
"හාරි හාරි.. දැන් ඉතින් බඩ පිනුම් ගහල අඩු කඩා ගන්නැතුව ඉන්වා.. අපි යුතුකම් කරා.. අපිට කැමෙන් බීමෙන් සලකන එකයි ඇත්තේ ඔන්න.."
"හරි හරි අනේ දෙන්නන්.. බඩජාරියා.. මම තියනවා ගුඩ් නයිට්.."
"යැයි යැයි තමයි, හරි හෙට මීට් වෙමු ගුඩ් නයිට්.."

ඇසිල්ලක වේගයෙන් මාසයක කාලය ගෙවුනි. මන්දාකිනි ඇගේ සියලුම අවධානය හා උත්සහය යොමු කලේ විභාගය වෙතටයි. විභාගයේ අවසන් බදාදා දින සන්ධ්‍යාවේ ඇ පසුවුනේ කූඩුවෙන් මුදා හල කිරිල්ලියක සේ සතුටින් හා නිදහසිනි. ඉදින් ඔහු හා හමු වීමට උද්දාමයෙන් බලා සිටි ඇය ඒ සදහා පිඹුරුපත් සකසන්නට වුනි.

"අම්මා.. මට මාලිගාවට යන්න ඕනෙ සෙනසුරාදට.. නංගිටත් ක්ලාස් නේ උදේ මම තාත්ති එක්කම ගිහින් නංගි ක්ලාස් ඇරෙන වෙලාවටම තාත්ති එක්කම එන්නන්.. පැය දෙකක් වගේනේ.. හාද.. හානේ.."
"තාත්තගෙන් ඇහුවද දැන්.."
"අම්මා හා නන් එයා හා කියනවනෙ කොහොමත්… යන්නන්ද.."

"හ්ම්ම් හ්ම්ම් හැබැයි පරිස්සමට.. මාලිගාව කියන්නෙ නුපුරුදු තැනක් නෙවෙයි නිසා යවන්නේ.. මටත් උදේ වරුවෙ වැඩක් තියෙනවා එදාට නැත්තන් මාත් එනවා.. තාත්තිටත් තනි රකින්න එන්න බෑ ඒ නිසා පරිස්සමට ලොකු දූ.."

"හරි අනේ ඔයාගේ දූ පොඩි ලමයෙක් නෙවේනේ.. පරිස්සමට ගිහින් එන්නන්.. තැන්ක්යූ අම්මී.. උම්මා.."
"අනේ කෝලං.. ඉස්සෙල්ලා තාත්තිගෙනුත් අහන්න.."
"හරේ.. එච්චා අවුලක් නෑ.." යැයි පවසා ඇ කාමරයට දිව ගියේ පස්වනක් ප්‍රීතියෙනි.

සෙනසුරාදා දින උදෑසනම නැගිටගත් මන්දාකිනි කිරි ආහාර පිසීම සදහා මේබලාටද උදව් කොට අවශ්‍ය තෙල් මල් හදුන්කූරු ද පිලියෙල කරගනිමින් ලක ලෑස්ති වූයේ පින්බිම වන්දනාමාන කොට ඔහු දැකීමටයි. දිගු සුදු පැහැ සායකින් හා අත්දිග සුදු බ්ලව්සයකින් සැරසුන ඇ කැරලි කොන්ඩය එකතු කොට කටුවක් රැදවූවාය. ඇගෙන් දිස් උනේ වෙනදා මෙන් දකින කෙලිලොල් පෙනුමකට වඩා ශාන්ත වූ නිවුනු පෙනුමකි.

උදෑසන 7.30ට පමන මාලිගාව වෙත පැමිනි මන්දාකිනි ඔහු හමුවට තවත් වේලා තිබූ බැවින් දන්ත ධාතූන් වහන්සේ සිත් සේ වැද පුදා ගැනීමෙන් අනතුරුව පැමිනියේ වැල් බෝධිය දෙසටයි. පැමිනි සෑම උදෑසනක එතරම් සෙනගක් නොවූ දිනක ඇ පුරුද්දක් ලෙස බෝධිය වටා ඇමදීම සිදු කරන්නේ මල් පූජා කර බෝධිය නෑවීමට පෙරයි.


8

බෝධිය වටා නැමදීමෙන් පසු ඇය සිටියේ ඔහුගේ පැමිණීම බලාපොරොත්තුවෙනුයි. එතෙක් සිත සන්සුන් කරගැනීමට ඇය ආනාපාන සති භාවනාවේ යෙදෙමින් බුදු කුටිය අසල රැඳී සිටියාය.
"යශෝ.."
දෙනෙත් විවර කොට බැලූ ඇය දුටුවේ පින්වන්ත සිනාවකින් වත පුරවාගෙන සිටි කඩවසම් ඔහුගේ රුවයි.
ඇද පෙරලා සිනාසුනාය.
"ගොඩක් වෙලාද ඇවිල්ලා.." මේඝ විමසා සිටියේය.
"හ්ම්ම්.. ඒත් මට හිතුන ඔයා මෙතනදි හම්බෙයි කියලා අයියේ.."
"ඒ මොකෝ ඒ.."
"නෑ ඔයා මෙතනනෙ ගොඩක් වෙලා ඉන්න කැමති.. ඒක නෙවෙයි අද හරිම පිං පාටයි ඔයා.. තනි සුදු ඇඳලා.. කවදාවත් නැතුව.."
"හ්ම්ම්.. ඔයත් හරිම පිං පාටයි.. අද ටිකක් මට විශේෂයි.. අපි බෝධිය පිටි පස්සෙ වැලි මලුව ලගට යන්.. මෙතන වන්දනා මාන කරන තැනක්නේ.. කතා කර කර ඉන්න හොඳ නැනේ.."
"හා.. යන්න කලින් මල් පූජා කරලා යන්.. මේ මල් වට්ටියට අත ගහන්නකෝ.. දෙන්නම පූජා කරමු.."
දෙදෙනාම මල් පූජා කොට පසුපස වැලි මලුව වෙත පැමිණ වාඩි වී මොහොතක් නිහඬව සිටියේ කව්රුන් මුලින් කතා කරාවිදැයි සිතමිනි.

"සුදූ.. විභාගේ හොඳට කරාද.."
"හ්ම්ම් හොඳට කරා කියල හිතෙනවා අයියේ.. ආයි රිවිශන් යන්න ඕන වෙන එකක් නෑ.. කෝසස් ටිකක් බලන්න ඕනේ රිසල්ට්ස් එනකන් කරන්න.."
"හොඳටම ශුවර් නන් කමක් නෑ.. මට හරිම සතුටුයි ඔයා ගැන.. මට ඔයාට දෙයක් කියන්න ඕනෙ.."
"මො.. මොකද්ද?" රතු වුන වතින් නෙතු බිමට කරන් ඇය බලා සිටියේ ඔහු තම ප්‍රේමය ප්‍රකාශ කරන තෙක්ය.
"මට පොඩි ගමනක් තියෙනවා යන්න.. ඔයාට කියලම යන්න ඕන නිසා හිටියේ.. "
"අනේ ඔයා කොහෙද යන්නේ.. " ඈ හැඩුම්බරව ඔහුගෙන් විමා සිටියාය.
"මම ඔයාට කියන්නනන්කෝ.. අනික තව දෙයක් තියෙනවා හිතේ.. ඒකත් කිව්වම මම නිදහස් වෙයි..

"ඇත්තටම මම ඔයාට ආදරෙයි යශෝ.. ඒක වචනෙන් නොකිව්වට මෙච්චර දවසක් ඔයාටත් ඒක තේරුනා ඇති කියලා මම හිතනවා.. අනික ඔයාටත් මම ගැන ඒ විදිහටම දැනෙනවා කියන්නත් මම දන්නවා.. ඒත් මට ඒක අද කියන්න ඕන උනා.."

ඇය මෙපමණ කාලයක් ඔහු පවසාවි යැයි බලා සිටි දෙය මේ භූමියේදීම දැන ගැනීම ගැන මන්දාකිනිගේ සිත තිබුනේ ප්‍රීතියෙන් ඉපිලී ගොසිනි.

"දරුවෝ.. අනික් දේ.."
ඔහු සැරසෙන්නේ කුමක් හෝ බැරෑරුම් දෙයක් පවසන්නට වග හැඟී ගියෙන් මන්දාකිනි මේඝ වෙත නැවතත් බැලුම් හෙලුවා.

"ඔයා මට පොරොන්දුවක් වෙන්න ඕනේ.. හැමදාම ඔයානේ පොරොන්දු ගන්නේ.. අද මට තියෙනව පොරොන්දුවක් ගන්න.." සිනාසී ඔහු පවා සිටියා.
"කියන්න.. මං පුලුවන් දෙයක් නන් ප්‍රොමිස් වෙන්නන්.." ඔහුගේ දෙස දෑස් අයමින් ඇය පවසා සිටියා.

"මම ඔයාගෙන් බැරි දේවල් ඉල්ලන්නෑ යශෝ.. මට ප්‍රොමිස් වෙන්න හැමදාටම.. ඔයගෙ ගෝල් එකට යනකන් කිසිම හේතුවක් නිසා ඔයගෙ ගමන මග නතර කරන්නැතුව යනවා කියල.. මොකද ඒක ඔයගෙ අම්මගෙයි තාත්තගෙයි වගේම මගෙත් සතුට.."
"අනේ බය හිතෙනවනේ ඔහොම කිව්වම.. මට ඔය හැමෝම ඉන්නවනෙ.. එතකොට ඇයි මම වොරි වෙන්නේ.."

"හ්ම්ම්.. ඔයා දැන් වගකීමෙන් ජීවිතේ දිහා බලන්න ඕනෙ කාලෙ ඇවිත්, මම කියන්නෙ නිදහසේ ඉන්න එපා කියල නෙවෙයි.. ඒත් තව කාලෙකින් අම්මලව සතුටින් තියල එයාලව බලා ගන්න ඕනේ.. ඒකට අපි ශක්තිමත් වෙන්න ඕනේ.. ඉතින් පුලුවන්ද දැන් ප්‍රොමිස් වෙන්න මට.." නැවතත් ඇගේ වත දෙස ආදරයෙන් බලමින් මේඝ විමසා සිටියා.

"හා.. ප්‍රොමිස් වෙන්නන්.. හැබැයි කැම්පස් යනකන් මම නිදහස් පුරවැසියෙක් ඔන්න.." ඈ ඔහු වෙත විරිත්තමින් කියා සිටියා.

"හැමදාම සතුටින් ඔහොම හිනා වෙලා ඉන්න යශෝ.. ජීවිතේ හැමදාම එක විදිහට තියෙන්නැති වෙයි.. ප්‍රශ්න එයි.. ඒත් ඒවා දරාගෙන ඔය විදිහටම හිනා වෙලා ඉන්න.. මම ලග හිටියත් නැතත්"

මේඝගේ දිස්න දෙන දෑස් ඈ දුටුවේ එවිටයි. සිනා සෙන විට කුඩා වන ඔහුගේ දෑස් දැකීමට ඇය ප්‍රිය කලා. ඇය ප්‍රිය කරන අයුරින් ඔහු සිනා සු විට ඇය ඒ රුව තදින් සිතේ අල්වා ඈද ගත්තෙ නොමැකී යන පරිදි.

එවිටම වාගෙ නද දුන්නේ ඇගේ ලග වූ දුරකතනයයි.
"අහ් හරි තාත්ති.. ලගද ඉන්නේ.. ඔව් වැදලා ඉවරයි.. හරි.. පිටිපස්ස කාර් පාර්ක් එක ලග ගේට් එක ලගට මම එන්නන්.. බුදු සරනයි.."
ඇය ඔහු දෙස බැලුවෙව් සෝක වතිනි.
"තාත්ති ලගලු ඉන්නේ.."
"හ්ම්ම් එහෙනන් කාලෙ ඉවරයි නේ..
"පරිස්සමට ඉන්න මේස.. තෙරුවන් සරනයි.."

ඇයට මේසගෙන් සමුගෙන යාමට වූයේ මහා ලෝබ කමකි.. "පරිස්සමට යන්න යශෝ.. තෙරුවන් සරනයි.." ඔහු නෙතු අගත් කඳුලු බිඳුවක සේයාවක් ඇ හට පෙනුනි.

සමුගෙන මද දුරක් ගොස් නැවත හැරී බලන කල තවමත් ඈ යන දෙස බලා සිටින ඔහුව ඇයට පෙනුනි. නැවතත් අත වනා සිනාසී ඇය පියා හමුවට පැමිනියා.
"මොකෝ මේ හැපී මූඩ් අද.."
"අයියෝ එහෙම විශේෂයක් නෑ තාත්ති.. අද හිත සැහෙන්න නිදහස් උනා.."
"හරි හරි.. මෙහෙමම නංගිවත් අරන් යමු.."
අනතුරුව ඇය ඇගේ කල්පනා ලෝකයේ වෙලී ගියේ ඔහුගේ මතක සමගයි. ඇගේ දැහැන බිදී ගියේ දුරකතනයට ආ ඇමතුම නිසා.

"හෙලෝ මන්දාකිනි මම නිශූ.. මම ගෙදරට ගත්තම ආන්ටි කිව්වේ මේකට ගන්න කියලා ඔයා අන්කල්ලා එක්ක එලියට ආවා කියලා.."
"කියන්න නිශූ.. අපි හෙටනේ මීට් වෙමු කිව්වේ අපෙ ගෙදරදි.. මොකෝ කලබලේ.."
"අනේ බං අපෙ අර ක්ලාස් එකේ හිටිය මාශිට ඩෙංගු හැදිලා.. කට්ටියම දැන් හොස්පිට්ල් යනවා කිව්වා.. ඔයත් එනවද?"
"අදද.. මම තාත්තිගෙන් අහලා එන්නන්.. හරි හරි ටක් ගාල කෝල් බැක් කරන්නන්.."
"තාත්ති.. අපේ පිසික්ස් ක්ලාස් එකේ හිටිය මාශි ඉන්නේ.. එයාට ඩෙංගු හැදිලා.. ක්ලාස් එකේ කට්ටිය යනවලු එයාව බලන්න දැන්.. මාත් ගිහින් එන්නද.. නිශූ ටක් ගාල කියන්න කිව්වා.. 12ට කට්ටිය ගුඩ් ශෙඩ් එකෙදී මීට් වෙලා යනවලු.. මාත් යන්නද.."

මොහොතක කල්පනවෙන් පසු පියා ඇය වෙත හැරී..
"හ්ම්ම් පරිස්සමට හැබැයි.. මම අම්මට කියන්නන්.. නංගිවත් අරගෙන මම ශෝට් ඊට්ස් මොනව හරි අරන් දෙන්නන් කාල යන්න.. නැත්තන් ලන්ච් එකත් මිස් වෙනවනේ.. සල්ලි මං බහිද්දි දෙන්නන්.."

"හරි තාත්ති තැන්ක් යූ.. මම නොගිහින් ඉන්න එකත් හරි නෑ වගේ.. අපි එකටමනෙ හිටියේ.."

"හෙලෝ නිශූ.. මේ මාත් එනවා.. හරි එතනදි මීට් වෙමු බායි"

ගැහැනු ළමුන් 7දෙනෙකුත් පමන එක්ව සිටියෝය. සියල්ලන්ම එකට පිටත් උනේ රෝහල කරායි. එය පෞද්ගලික රෝහලක් වූ නිසාවෙන් කරදරයකින් තොරව සියල්ලෝම මාශි හමුවිය.
ඇගේ පාලුමැකීමට සියල්ලෝම පිරුන බැවින් මාශිගේ මව කාමරයෙන් එලියට ගියේ මාශිගේ වෛද්‍ය වාර්තාවක් රැගෙන ඒමටයි.
"මොනා හරි කමු කට්ටියම නේ තියෙන දෙයක්.."
අවාසනාවන්ත ලෙස මාශිගේ කටින් පිටවූ වදන් පෙල නිසාවෙන් සියල්ලෝම ලෙඩාට ගෙනැවිත් තිබූ පලතුරු, බිස්කට් හා බීම අවසන් කිරීමට පටන් ගත්තා.
"අප්පේ කියපු ගොන්කම මගේ.. මටත් පොඩ්ඩක් හරි ඉතුරු කරව් යකුනේ.. තාත්තා එන්නේ හෙට දවල්ට ආයි.." හිසේ අත තබා ගනිමින් මාශි කියා සිටියා.
එයින් පසු කෑම ගැනීමේ වේගය බාල කල සියල්ලෝ තැනින් තැන වැටී සතුටු සාමිච්චියේ යෙදුනා.
නිශූහට විභාගයෙන් පසු ප්‍රියතම රාජකාරිය වූ ෆේස් බුක් ගිනුමේ සැරිසැරීම නිසා මන්දාකිනිද එහා පස වූ මිතුරියක් සමග කතාවට වැටුනා. නිතරම තවෙකෙකුගේ ඕපදූප සෙවූ අයෙක් වූ ඇය මේ දිනවල ඇය සොයා ගත් නවතම තොරතුරු දිග හැරීමට පටන් ගත්තා.
"මේ මන්දාකිනි.. ඔයාල හෙට රෑ නර්මදාගෙ එන්ගේජ්මන්ට් එකට යනවද"
"යන්න තමයි හිතන් ඉන්නේ සේයා.."
"අපිටත් ඉන්වයිට් කලා.. මදුර සර්ගේ දුව වෙලත් අපරාදේ දැන්ම එන්ගේජ් වෙන්නේ.. අපි විභාගේ කලා විතරනේ..."
"ඒකනන් ඇත්ත.." මන්දාකිනි එය ගැනකතා කිරීමට වැඩි කැමැත්තක් නොපෙන්වා කියා සිටියා.
"ඒ මැරි කරන්න ඉන්න අයිය රට යනවලු.. ඒ නිසා එන්ගේජ්මන්ට් එක හදිසියෙ ගන්නේ කිව්වා නර්මදා කලින් දවසක මට.."
මාශි අසල තිබූ පලතුරු පානය ඉල්ලූ නිසා මන්දාකිනි වහා නැගිට ඇය අසලට ගියේ තවත් ඕප දූප කතා කිරීමට කැමැත්තක් නැති නිසාවෙනි.

පැය කිහිපයක් මාශි අසල රැඳී සිට යෙහෙලියන් පිටත් වූයේ රාත්‍රිය වීමට පෙර නිවෙස් වලට යෑමටයි.

පසුදින හවස් වන විට මන්දාකිනි සැරුනේ ලා රෝස පැහැ සාරියකිනි. ප්‍රථම වතාවට සාරියක් ඇඳි නිසාවෙන් නුහුරු ගතියක් දැනුනද සියල්ලෝම සාරියක් අඳින්නට කතිකා කර ගත් නිසා ඇයට කල හැක්කක් නොවිනි.
මන්දාකිනි පහල මාලයට එන විට ඈ දුටු නැගනිය කෑ ගැසුවා.

"මේ සෙනේගේ දෝනිද.. බුදු අම්මෝ ලස්සන.."
"අනේ යන්න චූටි මම මේ හරි අමාරුවෙන් ඉන්නේ.. විහිලුකරන්න එපා…"
"විහිලු නෙවේ හලෝ ලස්සනයි.. අද නන් මට මස්සිනා කෙනෙක් හොයන් තමා ඔයා ගෙදර එන්නේ.."
"ආයි අමුතුවෙන් හොයන්න දෙයක් නෑ දැන්.." මන්දාකිනි තම නැගනියට රහසින් පවසා සිනසුනා.
"මොකක්.. අක්කේ ඒ මොකද්ද ඒ කිව්වේ.. විස්තරේ හරියට කියන්න.."
"හරි හරි මම ගිහින් ඇවිත් කියන්නන්..ඔයාට නොකියන දෙයක් නැනේ.. අම්මලට මුකුත් කියන්න බෑ හැබැයි හරිද.."
"හරි හරි.. ඉක්මනට ගිහින් එනවා එහෙනන්.. මට හිතුනා ඒත් ඊයෙ දවල් මූන දැක්කම.."
ඇය දෙසට මද සිනාවක් පා මන්දාකිනි ගියේ පියා සොයාගෙන ඉක්මනින් නර්මදාගේ උත්සවයට යෑමටයි.."

උත්සවය තිබූ හෝටලයට බැස්සවූ මහානාම මන්දාකිනි අතට මේබලාගේ දුරකතනය දී පැවසුවේ රාත්‍රී 10 ට නැවතත් ඇය රැගෙන යාමට පැමිනෙන බවයි.
හෝටලය තුලට පිවිසෙන ද්වාරය අසල ඈ නැවතුනේ නිශූ පැමිනෙන තෙක්ය.
ටික වේලාවකින් කව්රුන් හෝ තමා දෙස බලා සිටින බව හැඟී ගියෙන් මන්දාකිනි වට පිට බලන විට දුටුවේ තමා දෙසට ඇවිද එන තරුනයෙකුයි.

"හෙලෝ ඔයාද මන්දාකිනි කියන්නේ…"
"ඔව්.. ඇයි" මන්දාකිනි නොරිස්සුමෙන් පවසා සිටියා. මෙසේ නොදන්නා තරුනයෙකු සමග කතා කර කර සිටින්න ඇය කැමති වූයේ නෑ.
"මම ඔයා එනකන් බලන් හිටියේ.. මේක යසස් ඔයාට දෙන්න කිව්වා.." ඔහු ඇය අත තිබ්බේ හතරට නවන ලද ලියුමකි.
"මම යන්නන්.."
"හරි තැන්ක්යූ.. ඒත් ඔයා කොහොමද මාව.." ඇයට කියන්නට ගිය දෙය ගිල ගන්නට සිදුවූයේ තමා දෙසට එන නිශූ දැකීමෙනි.

"අනේ සොරි මන්දාකිනි ලේට් වුනා ටිකක්.. ඔයා ගොඩක් වෙලාද ඇවිත්.."
"එච්චර වෙලාවක් නෑ නිශූ.. කොහොමත් අපි දෙන්නම ලේට් දැන් එන්ගේජ්මන්ට් එක ඉවර වෙලා පාර්ටි එක ඇත්තේ.. කෙලින්ම විශ් කරලා යන් දෙන්නටම.."
"හ්ම්ම් ඔව් නේ.. කොහොමත් අපි කලින් යන නිසා රෑ වෙනකන් ඉන්නෙ නැතුව දැන්ම විශ් කරල යන එක හොඳයි"

ශාලාවට ඇතුල් වන තැන "Narmada &Basuru" ලෙස සටහන් කර තිබූ නිසාවෙන් දෙදෙනාම ඉක්මනින් ඇතුල් වුනි.

ශාලාවේ ඉදිරියට මද දුරක් යන විට මන්දාකිනි කලබල වූයේ නෙත ගැටි මේසගේ රුව දැකීමෙනි. නිශූ අත අල්වා සිටි බැවින් කිසිවක් කල නොහැකි වූ නිසා ඇයට දැනුනේ තමා සීතල වී යන බවකුයි. දෙදෙනාම නැවතුනේ නර්මදා සහ ඇය අත ගත් මන්මාලයා අසලයි.
මන්දාකිනි සිටියේ ගොලු වීමෙනි. ඇයට හැඟී ගියේ තමාගේ හදවත පසාරු කරගෙන ගැඹුරට කිනිස්සක් බැස්සූවාක් මෙන් වේදනාවකි. ඒ සිටියේ ඔහුයි. නමුත් එසේ වන්නේ කෙසේදැයි ඈ සිතුවා. මෙතරම් රැවටීමක්.

පෙරදින තමා හා හමුවී ප්‍රේමය ප්‍රකාශ කල මේස අද නර්මදා අසලින් සිටගෙන සිටී. ඉදින් ඔහු අද සිට ඇගේ සැමියායි. ඇය මොහොතකට ඇස් වසා සිට නැවත විවර කලේ මෙය ඇස් බැන්දුමක් නොවන වග සැක හැර දැන ගැනීමටයි. ඇයට කිසිවක් පැවසීමට හඩ පිට නොවුනි. විමතියෙන් හැරී බැලූ නිශූ ඔවුන් දෙදෙනාම වෙනුවෙන් නර්මදා හට සුභ පතා මන්දාකිනි රැගෙන පිට වී ශාලාව කෙලවරට පැමිනියා.

"මන්දාකිනි.. මොකද උනේ.. ඔයා ශොක් වෙලාවගේ හිටියේ විශ් කලේවත් නැනේ.."
"අනේ නිශූ.. ඒ මගෙ මේස දෙයියනේ.."
"පිස්සුද බං.. ඊයේ කැමති කිව්ව මනුස්සයා මෙහෙම අද නර්මදාව මැරි කරයිද.."
"ඒක බොරු වෙනවනන් මාත් කැමති නිශූ.. ඒත් ඒ මේස.. ඔයා දැක්කද එයත් මාව දැක්කම ෂොක් උනා.. අනේ අපි මෙතනින් යමු නිශූ.. මට හුස්මත් හිරවෙනවා වගේ…"
"හරි හරි අඩන්න එපා දැන්ම.. එලියට යන් අපි.. එතකන් කොහොම හරි ඉන්න.. ඔයාව එහෙම රවට්ටලානන් කොහොමත් ඒ මිනිහා ඉස්සරහ එක කඳුලක් වට්ටන්න එපා.. යමු එලියට"

හෝටලය පිටත වූ උයනේ බංකුවක වාඩි වූ විගස මන්දාකිනි නිශූට වාරු වී ඇති තරම් හැඬුවා. හදිසියේ යමක් මතක් වීමෙන් හිස එසවූ ඈ තම අත් බෑගය පිරික්සුවා.

ඔව් ඇය අත තිබුනේ ඔහු දෙන්නට යැයි කියූ ලියුමයි. වෙව්ලන දෑතින් මන්දාකිනි එක විවර කලා.

“මගෙ යශෝ වෙත,

මට සමාවෙන්න…
මුලින්ම කියන්න ඕන ඒක.. ඔයා අද දවසේ දකින්නේ ඇත්ත දේ නෙවෙයි. ඒත් මගෙ අතින් ඔයාට උනේ වැරැද්දක්.. ඔයාට කරපු වැරැද්දට මට කවදාවත් සමාව දීගන්න බැරි වෙයි, ඒත් මම අසරනයි.. ඔයාව හම්බෙලා මේක කියන්න මට හයියක් නෑ..
නර්මදා මැරි කලේ මම නෙවෙයි.. මගෙ ට්වින් අයියා බාසුරු.. ඔයා දැන් දන්නවා ඇති මගෙ තාත්තා තමයි ඔයාගෙ පිසික්ස් ක්ලාස් සර් කියන්නෙ.. ඔව් ඔයා හරි මම තමයි ඒ කාලේ ඇක්සිඩන්ට් වෙලා icuහිටියේ. ඔයා බලනවා ඇති මම හොස්පිට්ල් හිටියා නන් ඔයාව මීට් උනේ කොහොමද කියලා.. මම හොස්පිට්ල් ඉද්දි එක පාරක් මට සිහිය ඇවිත් තිබුනා.. මම ඔයාගෙ නම කියලා තිබුනේ, මගෙ අයියා අපි ගැන හැම දේම දැනන් හිටියේ.. එයා දන්නවා මම ඔයාගෙ එක්සෑම් ගැන කොහොමද වද වෙන්නෙ කියලා.. ඒ නිසා මට හොද වෙනකන් කිසිම වෙනසක් නොකර ඔයාව මීට් වෙන්න ආවෙ මගෙ අයියා බාසුරු.. එයා ඔයා ගැන හැම දේම දන්න නිසා ඒක ලේසි උනා..

ඒත් ඒ මාස දෙකට ගොඩක් දේවල් වෙනස් උනා.. එයා නොදැනුවත්වම මාස දෙකක් ඉවර වෙනකොට ඔයාට ආදරේ කරන්න පටන් අරන්… ඒත් එයා මට ඒක කියලා ගොඩක් සමාව ඉල්ලුවා.. ඒ කාලේ වගේ තමයි අයියා එයාගෙ හිත හදා ගන්න කියලා අපෙන් ඈත් වෙන්න තීරනය කලේ.. එයා ඩිසයිඩ් කලා හයර් ස්ටඩීස් වලට ඕස්ට්‍රේලියා යන්න.. අම්මල හිතුවේ අයියා කාලෙකට ආයි ලංකාවට එන්නැති නිසා එයාට හොද ගර්ල් කෙනෙක් හොයලා එන්ගේජ් කරන්න..නර්මදාගේ තාත්තයි අපෙ තාත්තයි ඒ කාලෙ ඉදන් යාලුවෝ නිසා තමයි එයාගෙ ගෙදරට ප්‍රපෝසල් එකක් ගෙනිච්චේ.. එයාට ඔයාව අමතක කරන්න ඕන උන නිසා අම්මල ගෙනාව යෝජනාවට කැමති උනා.. එයා ඒ හැමදේම කරන්නේ මම වෙනුවෙන් කියන එක මට ඔලුවට ලොකු බරක් යශෝ..

මම කවදා හරි ඔයාව මැරි කරත් මගෙ අයියගෙ හිත රිද්දල නේද මේක කරන්නේ කියලා මට හැම වෙලේම හිතුනා.. ඇත්ත.. මම ඊයෙ ඔයාව හම්බෙලා ආදරෙයි කිව්වා.. ඒ මම යන්න කලින් මට ඔයා ගැන තිබුන හැඟීම බොරුවක් නෙවෙයි කියලා ඔයාට තේරුම් කරන්න.. ඒත් මට අද දවස ගැන සතුටු වෙන්නවත් ඉක්මනින් හැමදේම අමතක කරන්නවත් බෑ..

ඒ මගෙ හැමදේම පොඩි කාලේ ඉදන් බෙදාගෙන මගෙ හැමදේටම ලගින් හිටපු මගෙ සහෝදරයා..

මට මේ හැම දේටම සමාවෙන්න යශෝ.. ඔයාට මේ ලියුම හම්බෙන කොටත් මම ලංකාවෙන් පිටත් වෙලා ඉන්න පුලුවන්.. මට USA වලට ඩිග්‍රී එක කරන්න ස්කොලශිප් එකක් හම්බුනා.. මම ඒක ඇක්සෙප්ට්කරපු ගමං කෝස් එක පටගන්නත් කලින්ම එහෙට යන්න රික්වෙස්ට් කලා.. මොකද මගෙ අයියා මම වෙනුවෙන් එයාගෙ සතුට කැප කරපු එකවත් එදාට ඔයාව හම්බෙනකොට මම කොහොම හැසිරෙයිද කියන එකවත් මට හිතා ගන්න බැරි උනා..

මම ආයි ඔයාව හොයාගෙන එයිද නැද්ද කියලා මම දන්නෑ යශෝ.. හිත හදා ගත්ත දවසක මම ආපහු එන්නෙ.. ඔයා මෙතනින් පස්සෙත් ජීවිතේ ඉස්සරහටම යන්න.. මම ඔයා වෙනුවට මගෙ පවුල තෝර ගත්ත එකට පුලුවන්නන් මට සමාව දෙන්න..

මීට
මේඝ.

ඉදින් අල්ලා ගත් විටෙක සතුටක් වූවත් බැදීම් යනු දුකකි. එසේ වුවද පෘතග්ජන මිනිසුන් වූ අපි බැදීම් අත් හැරීමට තරම් ශක්තිමත්ද? නැත එයයි මේ ලෝකයේ පැවැත්ම.

එතැනින් පසු මන්දාකිනි හට ඇගේ ඉදිරි මාස කිහිපය ගෙව්නේ කෙසේදැයි සිහියක් නොවුනි. මේඝා දෙයකට මුහුන දෙන්නට වෙතැයි ඇය කෙදිනකවත් නොසිතුවාය. සියල්ල අනිත්‍යය වූවත් මේඝ වෙනස් වේ යැයි ඇය කිසි දිනක සිතුවේ නැත. ඔහු වෙත වෙන් කර තිබූ ඉඩ වෙනකෙකු හට කිසිදාක දීය නොහැකි වන තරමට ඇය ඔහුට ඇබ්බැහි වී සිටියා. නමුත් ඇය වෙනුවට තම සහෝදරයා තෝරා ගැනීම ගැන මේඝට වෛර කිරීමට මන්දාකිනි හට නොහැකි උනා. අවසානයේ ඇය තම දෙමව්පියන් හා තම සිහිනය වෙනුවෙන් තනිව නැගී සිටියා. තවත් ඇයට සත්‍ය ප්‍රේමය කියා යන්නක් ගැන විශ්වාසයක් තිබුනේ නෑ. සියල්ල මනුශ්‍යා විසින් තම ජීවිත කාලය තුල තනිකම මකා ගැනීමට ගොඩනගා ගන්නා සම්බන්ධතා බවට පමනක් ඈ විශ්වාස කලා.. නැවතත් කිසිදිනෙක හෝ මේඝ පැමිනියත් ඔහු හට පෙර තිබූ ආදරය ඇති නොවන ලෙස ඇගේ විශ්වාසය ඔහු බිද දමා ඇති බව ඇයට පසක් උනා. ඉතින් තවෙකෙකු තුලින් නොව තමා තුලින් සතුටු වීමට ඇය අවසානයේ ඉගෙන ගත්තා. මේඝයකට වුවත් නොසෙල්වෙන පරිදි අවසානයේ මන්දාකිනිය නිසල උනා.

සමාප්තයි

***නිලුපුලී තිලෝත්තමා***
*The University of Tokyo*

# සිත් රූ



**Environmental protection**
Navinu Yasmith






**Fish tank**
Navinu Yasmith




**Kasun Thalgaskotuwa**
The University of Tokyo



**Lasalu Nawam Dharmarathna**
Grade 5

**Mother's Love**
Navinu Yasmith






**Rainy Day**
Navinu Yasmith



**Rambutan Season**
Navinu Yasmith



**My Dream Car**
Kaveen Ameesha
Grade 4

**Migara Rathnayaka**

Tokyo Medical and Dental University





**Migara Rathnayaka**

Tokyo Medical and Dental University



**Beauty of Nature**


Dr. H. M. Ayala Sunali Herath



**A Blue Touch to Nature**

Dr. H. M. Ayala Sunali Herath





**ජපානයේ Tokyo International University හි උපසභාපති ලෙසත් එහි Graduate school of business studies and commerce හි හිටපු පීඨාධිපති ලෙසත් Matsushita පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂක ලෙසත් Digital business and strategy යන අංශයෙහි වර්තමාන කථිකාචාර්යවරයෙක් වශයෙනුත් සේවයේ නිරත වන මහාචාර්ය ජේ. රාජසේකර මහතා සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව**

සාකච්ඡාව කළේ: තිෂූලි වල්පොල
සංස්කරණය: තිෂූලි වල්පොල, මිගාර රත්නායක

- **මුළින්ම ඔබතුමන්ගෙන් අපි වැඩිය අහලා දැකලා නැති පැතිකඩකින් ප්‍රශ්නය යොමු කරන්න මං හිතුවා. ඔබතුමාගේ ළමා කාලය සහ පාසල් අවධිය ගැන යමක් මතක් කළොත්..**

පාසල් කාලයේ ගොඩක් මතක තියෙනවා. පොඩිම කාලේ අපෙ අම්මට Asthma වගේ එකක් හැදිලා මං හිටියෙ නෑ ගෙදර. ආච්චි අම්මා එක්ක තමයි හිටියේ. ආච්චි අම්මටත් වෙන කවුරුත් හිටියේ නෑ මං විතරයි හිටියේ බලාගන්න. ආච්චි අම්මා එක්ක තමයි ගොඩක් මතකයන් තියෙන්නෙ. උදේ පාන්දර ඉස්කෝලෙට යනවා එයත් එක්ක. මං ආපහු එනකන් ආච්චි අම්මා එතනට වෙලා බලන් ඉන්නවා. මං ඉස්කෝල කිහිපයකටම ගියා. අන්තිමට ඉස්කෝලේ ගියේ බත්තරමුල්ලේ ඉඳලා. කොළඹ තස්ටන් විද්‍යාලයටත් උසස් පෙළට ධර්මපාල කොලේජ් එකටත් ගියා.

- **ඔබතුමාගේ උසස් අධ්‍යාපන කටයුතු සහ විශ්වවිද්‍යාල ජීවිතය ගැන කිව්වොත්..**

උසස් පෙළදී මට හොඳ Maths professor කෙනෙක් හම්බුනා. ඒකත් එක්ක Maths අංශයෙන් ඉදිරියට ඉගෙන ගන්න ඕන කියලා හිතුවා. ඒ කාලේ ගොඩක් තාක්ෂණය වෙනස් වෙච්ච කාලයක්, කම්පියුටර්ස් එහෙම ඇවිල්ලා. ඔය කාලේ මම දැනගත්තා computer වල area එකක් තිබුණා queing theory කියලා. ඒක ගැන ඉගෙන ගන්න ආසවක් ආවා. උසස් පෙළ ඉවර කරලා ඒ ගැන වැඩිදුර ඉගෙන ගන්න තීරණය කළා. ඊටපස්සේ කැම්පස් එකට ගිහින් queing theory ඉගෙන ගෙන ඒකෙන් paper එකක් ලිව්වා. ඒක publication එකකටත් දැම්මා. ඒ අතරේ ඒක මම ඇමරිකාවේ university එකකට යැව්වා ඒක ගැන ඉගෙන ගන්න ඕනේ කියලා. ඊටපස්සේ ඒ campus එකෙන් මට ස්කොලර්ශිප් (scholarship) එකක් හම්බුනා. ඒ අතරේ English exams එහෙමත් pass කරගෙන තිබ්බේ.

කොහොමහරි ඒ ඉස්කෝලේ හිටියා හොඳ professorsලා වගයක්. එයාලා දැනගත්තා මං හිතන්නේ මට යමක් කරන්න පුළුවන් කෙනෙක් කියලා. එක professor කෙනෙක් හිටියා එයා ඔය queing theory කියන පැත්තේ ගොඩක් ප්‍රසිද්ධ කෙනෙක්. එයා එකසැරයක් දීපු exam එකක හරියට answer කලේ මං විතරයි. මගේ answer එකත් ටිකක් වෙනස් විදියේ එකක්. කවුරුවත් වෙන කරන්නේ නැති එයත් නොදන්න විදිහේ answer එකක් තමයි දීලා තිබ්බේ. ඊටපස්සේ එයා ඒ සම්බන්ධව පැහැදිලා research assistant වගේ ජොබ් එකක් දුන්නා ඒ කැම්පස් එකේම. ඒ කාලෙ හැටියට ඒ ජොබ් එකට assistant professor කෙනෙක්ගේ වගේ salary එකක් හම්බෙනවා. ඊටපස්සේ ඒ අංශයෙන් ඉදිරියට අධ්‍යාපනය කරගෙන ගියා. Ph.D. එකට මගෙ supervisor නෙමෙයි වෙනත් අල්ගොරිත්ම් (algorithm) සම්බන්ධ ප්‍රොෆෙසර් කෙනෙක් එක්ක කරලා paper එකක් ලිව්වා. ඒක conference එකකට දැම්මා. ඒක ප්‍රසන්ට් කරපු වෙලේ ඒ audience එකේ හිටපු එක්කෙනෙක් කිව්වා මගේ CV එක එවන්න කියලා. මට ඒ කෙනා කවුද කියලවත් දන්නේ නෑ. ඊටපස්සේ මං කැම්පස් එකට ඇවිල්ලා CV එක ඇරියා. පස්සේ ඒ කෙනා මට කතා කරලා කිව්වා , එයා Bell laboratories වල ඉන්න එක්කෙනෙක්. ඒ කාලෙ Bell labs කිව්වොත් එතන තමයි Ph.D. කරපු අයට යන්න හොඳම ස්ථානය. ලෝක ප්‍රසිද්ධ research ස්ථානයක්. ඊටපස්සේ මං එතෙන්ට ගියා. එතෙන්ට ගියාට පස්සෙ තමයි මගෙ චරිතය වෙනස් වුනේ. මොකද එතන ඉන්නවා ගොඩක් competitive මිනිස්සු. මොකද ලංකාවෙ හිටපු විදිහට මං එහෙම හරියට කතා කරන්න එහෙම දැනගෙන හිටියේ නෑ. ඒවා හොඳට මට ඉගෙනගන්න පුළුවන් වුනා. ඒ මාර්ගයෙන් මගෙ එක එක කතා කරන විදි, මිනිස්සු අතර තියෙන සබඳතා improve කරගන්න පුළුවන් වුනා. ඒ හින්ද අනිත් අය නොකරපු වැඩ මට කරන්න පුළුවන් වුනා. මං දැන් උනත් පහළ ඉඳන් ඉහළ දක්වාම හැම කෙනාටම එක වගේ තමයි සළකන්නෙ. ඒ අය ඕන කෙනෙක් එක්ක මට කතා කරන්න පුළුවන්. ඒ ඕන කෙනෙක් මට උදවු කරනවා.

- **ඔබතුමාගේ විශ්වවිද්‍යාලය මතක් කළොත්..**

North Carolina Government Universities. ඒ කාලේ මං ඔය ඉස්කෝල ගැන දැනගෙන හිටියේ නෑ. මොකද මට ලංකාවෙ ඉද්දි කවුරුත් කිවුවෙ නෑ මේ විදිහට කරන්න එහෙම කියලා.

එක එක ඒවයින් හොයාගෙන මං කැමති විදිහට තමයි කරගත්තේ. ඒ කාලෙ දැන් වගේ එහෙම පිටරට වලට යන්නෙ නෑ ලංකාවෙන්. කොහොමහරි Bell labs වල ජොබ් එක හම්බුන එක ලොකු වෙනසක් මගෙ ජීවිතේ. මගෙ දක්ෂතාවයන් පාවිච්චි කරන්න හොඳ අවස්ථාවක්.

- **ඔබතුමා ලෝකෙ ප්‍රථම undersea කේබලය සඳහා ඇල්ගොරිදමය (algorithm) නිර්මාණය කිරීම වෙනුවෙන් පේටන්ට් බලපත්‍ර හිමියෙක්. ඒ ගැන මතක් කරමු..**

ඇමරිකාවෙ ඉද්දි මම කරපු එකම ජොබ් එක Bell labs වල ජොබ් එක. එතන ඉන්න කාලේ fiber optic technology එක පටන් ගත්තා විතරයි. Bell labs වල හිටියා ලෝක ප්‍රසිද්ධ මිනිස්සු. ඊටපස්සේ ඒගොල්ලො undersea cable එකක් දාමු කියලා තීරණය කරලා ඇමරිකාවෙ ඉඳන් යුරෝපය ට පළවෙනි undersea cable එක plan කළා. මගේ අල්ගොරිත්ම් (algorithm) එක design කරල තිබ්බ හින්දා ඒගොල්ලෝ මාවත් දැම්මා ඒ project එකට. ඔයාලා දන්නවා නම් ඒ optical communication එක, ඒක වෙන්නෙ laser light එකක් අරගෙන එක පැත්තක ඉඳන් අනිත් පැත්තට light එක යනකොට ටිකක් දුර යනකොට ඒ light එක weak වෙනවා. Weak වෙන්න ඉස්සෙල්ලා ඒක regenerate කරන්න ඕනේ. ඉතින් plan එක තිබුනෙ 50 km ක් ගියාට පස්සේ regenerate කරන්න ඕනෙ කියලා. ඊටපස්සෙ කොහොමහරි මම මගේ අල්ගොරිත්ම් එක දාලා ඒක 70km ක්ම දක්වා ගෙනියන්න පුළුවන් කියලා පෙන්නුවා. ඊටපස්සෙ තමයි ඒ අල්ගොරිත්ම් එක පාවිච්චි කරලා cable හදන්න පටන් ගත්තෙ company එකෙන්.

- **ඔබතුමා ජපානයට පැමිණීම සිද්ධ වුණේ කොහොමද?**

පළවෙනි cable එක දැම්මට පස්සෙ ඒගොල්ලො කිවුවා ගිහින් බලන්න ජපන් රටේ මිනිස්සු මොනවද කරන්නෙ කියලා මේ ගැන. ඊටපස්සෙ මට ජපානයට යන්න අවස්ථාව හම්බුණා. ටොක්යො (Tokyo) වලට ඇවිල්ලා මාස 9ක් විතර හිටියා. ඒ කාලේ මට හිතුනා ජපානය හරිම හොඳයි, මෙහෙ මිනිස්සුත් හරිම හොඳයි, මොකක් හරි chance එකක් තියෙනවා නම් මට මෙහෙට එන්න ඕනෙ කියලා. මොකද මං Bell labs වල වැඩ කලේ New Jersey කියන හරියේ. නිව් යොර්ක් (New York) වලට අල්ලපු එක. ඒ පැත්තෙ ගොඩක් මිනිස්සු ඉන්නවා. දාමරිකයො එහෙමත් ඉන්නවා.

ඒ නිසා ජපන් රට ගොඩක් peaceful කියලා දැනුනා. කොහොමහරි ටොක්යො වලදි හම්බුනා ප්‍රොෆෙසර් කෙනෙක්. එයාටත් මං මේ ගැන කියල තිබ්බා. කාලයක් ගියාට පස්සේ එයා International University of Japan business school එක ඇරලා තියෙනවා. එතන technology, IT, business teach කරන්න කෙනෙක් හොයනවා, පුළුවන් නම් try කරල බලන්න කිවුවා. ඊටපස්සේ එතනට CV එක යව්වා. මගේ CV එකේ reference දාලා තිබුනේ මං queing theory ඉගෙන ගත්ත ප්‍රොෆෙසර්. ඒ කාලේ IUJ එකේ හිටියා ඒ අංශයෙන්ම ප්‍රසිද්ධ තව ප්‍රොෆෙසර් කෙනෙක්. එයා reference එක දැක්ක හැටියෙම මං යමක් කරන්න පුළුවන් කෙනෙක් කියලා තේරුම් ගත්තා. තව Bell labs වලටත් ලොකු ප්‍රසිද්ධියක් තිබ්බා ඒ කාලේ. ඒ වගේම මගෙ හොඳ CV එකක් තිබ්බා. ඒ නිසා මාව එතනට hire කළා. hire කරන්න ඉස්සෙල්ලා මං company එකට කිවුවෙ නෑ මං ජපානේ යනව කියලා. කොහොමහරි new year holiday එකට ජනවාරි මාසේ මං නිගතා ආවා. ඒ එනකොට හිම පිරිලා. මිනිස්සු එහෙදි මට හොඳට සැලකුවා. මට කොහොමත් තේරුනා ඒ අය මට ජොබ් එක offer කරනවා කියලා. මං ආපහු ඇමරිකාවට ගියෙ කොහොමද මේ ජොබ් එකට ‘no’ කියන්නේ කියලා හිතාගෙන. මොකද මං මේ ගැන මගෙ company එකට කියලා තිබ්බෙ නෑ. කොහොමහරි මං ඇමරිකාවට ගියාට පස්සේ එහෙන් එක්කෙනෙක් call කළා පස් සැරයක්. ඒ කාලෙ හිටිය කැම්පස් එකේ business school dean, ඇමරිකන් ප්‍රොෆෙසර් කෙනෙක්. එයා පස් සැරයක් කෝල් කළා. පස්වෙනි සැරේට කිවුවා මං දෙනවා offer එකක් 'that you don’t say no' කියලා.And he wanted to buy an expensive computer for me. ඔය වගේ එක එක ඒවා කළා. කොහොමහරි මං අන්තිමට කම්පැනි එකට කිවුවා මේ වගේ චාන්ස් එකක් තියෙනවා ජපන් රටට යන්න බිස්නස් ස්කූල් (business school)එකට කියලා. ඒ කාලේ ජපානෙ කිවුවාම ටිකක් මිනිස්සු සළකනවා හොඳට ටෙක්නොලොජි (technology) එකට. කොහොමහරි company එකේ ලොකු කට්ටිය කිවුවා එහෙනම් ජපන් රටට ගිහිල්ලා එහෙ කට්ටිය කොහොමද මේ වැඩ කරන්නේ කියලා බලන් ඇවිල්ලා අපිට කියන්න කියලා. ඒ කරලා leave හිටන් මට දුන්නා එහෙ යන්න.

ඊටපස්සේ මං කිවුවා මං ගිහින් අවුරුද්දකින් ආපහු එනවා කියලා. මං අවුරුද්දකින් ආපහු යනවා කියලා IUJ එකට කිවුවහම ඒ අය කිවුවා යන්න එපයි කියලා. ඊටපස්සේ මං කිවුවා මං කම්පනි එකට පොරොන්දු වුනා ආපහු එනවයි කියලා. ඒ නිසා මට යන්න ඕනෙයි කියලා. ඊටපස්සේ ඒ අය මං එනකන් මගේ ජොබ් එක තියන් හිටියා අවුරුදු 5ක්. ඊටපස්සේ මං bell labs වලට ගියා. ඊටපස්සේ Tokyo International University එකේ අලුත් ප්‍රොග්‍රෑම් (programme) එකක් පටන් ගන්න ඕනේ කියලා හිතන් මං දන්න කැම්පස් එකේ ප්‍රොෆෙසර් කෙනෙක් මාව contact කළා. කතා කරලා මගෙන් එක එක ideas ගත්තා. ඊටපස්සේ මට කතා කරලා කිවුවා එහෙනම් මෙහෙම programme එකක් පටන් ගන්න කියලා. ඒකෙන් පස්සෙ තමයි ඉතින් මං ජපානෙට ඇවිල්ලා දැන් අද මේ ඉන්න තැන ඉන්නේ.

- **ඔබ ලබාගත් ජයග්‍රහණ ක්ෂේත්‍ර ගණනාවක තියනවා. අපි ඒවත් මතක් කරමු. ලියපු පොත් සහ ආර්ටිකල්ස් (Article) පිළිබඳවත් මතක් කරමු.**

ඇකඩමික්ස්ලා විදිහට අපි ලියන්න ඕනේ. නැත්තං ඇකඩිමික්ස්ලටත් මිනිස්සු සලකන්නෙ නැහැ. පොත් ලිව්වා. පෙළක් ඒවා Bell labs වල කලින් හිටිය කට්ටිය එක්ක ලිව්වා. Bell labs ඒවගේ එක pattern එකක් තමයි හුගක් වැඩ කරන්න එන අය ඒ කාලේ Ph.D. තියෙන අය. ආපුවහම ඒගොල්ලො කොහොම හරි ලියලා ප්‍රොෆෙසර්ස්ලා වෙනවා එක එක universities වල. එතකොට අර Bell labs කිව්වහම කොහොමත් නමත් තියනවා. ඒ නිසා ප්‍රොෆෙසර්ශිප් එකක් ගන්න ලේසි. මාත් එක්ක එකට වැඩ කරපු අය විවිධ ස්ථානවල ඉන්නවා. වෙන universities වල එහෙම. ඉතින් ඒ වගේ අය එක්ක මම පොත් වගයක් ලියලා තියෙනවා. අනිත් එක මම මෙහි දී හම්බවෙච්ච අයත් එක්ක පොත් කීපයක් ලියලා තියෙනවා. මම අනිත් අයත් එක්ක පබ්ලිකේෂන්ස් (publications) කරනවා. දැන් උනත් මම students ල එක්කත් ඒ වගේ දේවල් කරනවා. මම මගේ ජොබ් එක කරන්නෙත් මගේ research කරන්නෙත් මගේ support එකට නෙවෙයි, අනිත් අයගෙ support එකට. ඉතින් මං මගේ ළමයිට පර්සනලි (personally) විවිධාකාරයෙන් උදව් කරලා තියෙනවා. මොකද මටත් මිනිස්සු උදව් කරලා තියෙන නිසා. ඉතින් ඒක නිසා මට students ලා හම්බවෙනවා. ඒ අයත් research කරනවා, ඊයේ පෙරේදා තිබ්බ global Competition එකක gold prize එක හම්බුනා.

AI competition එකක්. ඒ වගෙ දේවල් කරන්න ඕනි කියලා මට හිතෙනවා. ඇකඩමික් කෙනෙක් වුනහම . ඒකයි ඉතින් හැමතැනම අඳුරන අය ඉන්නේ. ගියහම ඒගොල්ලො ඉතින් දන්නවා. මම වෙනස් පුද්ගලයෙක්. ඉතින් ඒකෙන් මට මගෙ සතුට ලැබෙනවා.

- **ජපානයට ආව මුල් කාලයේ ඒ ජීවිතය ගැන පොඩ්ඩක් මතක් කරමු.**

මෙහෙ එනකොට මම ජැපනිස් (Japanese) දන්නෙ ම නැහැ. කොහොමත් මේ ටික කාලයක් ඉන්නකොට මට තේරුණා ජපන් කතා කරේ නැත්නම් මේ රටේ ඉන්න බෑ කියලා.  ඊට පස්සේ මම කාර් එකක් ගත්තා. මම ජැපනීස් ඉගෙන  ගන්න එක class එකකටවත් ගිහින් නෑ. මම ගියා එක එක කඩවලට, එක එක ස්නැක් බාර්ස්වලට (Snack Bars). මට කාර් එක තියන නිසා යනවා. හැන්දෑවට ගිහින් ජැපනිස් අය එක්ක ම කතා කරපු නිසා තමයි ජැපනිස් පුරුදු වුනේ. Japanese පුරුදු වුනායින් පස්සෙ මට හිතුනා ජැපනිස් මිනිස්සු හොඳයි. ඒ මිනිස්සුත් එක්ක කතා කරන්න පුලුවන් කියලා. ඒකෙන් මට ජපන් රටේ ඉන්න එක කිසි ප්‍රශ්නයක් වුනේ නෑ. අනිත් එක මම ස්නැක් බාර්ස්, රෙස්ටුවරන්ට්ස් (Restaurants) ඒ වගේ ජැපනිස් නිසා මට ජැපනිස් අය කතා කරනවා වගෙ ජැපනිස් මටත් පුලුවන්. ටෙක්ස්බුක්ස් (Text book) ජැපනිස් නෙමෙයි. මම ලෙක්චර් එකක් කරලා තියනවා පැය දෙකක ජැපනිසවලින් නීගතා යුනිවර්සිටි (Niigata University) එකේ ප්‍රොෆෙසර්ස්ලට. එක පංතියකටවත් ගිහින් නෑ ජැපනිස් ඉගෙන ගන්න. ඉතින් ඒ වගෙ වැඩ මම කරනවා. කොහොම හරි ජැපෑන්වල ඒ නිසා ප්‍රශ්නයක් නෑ.

- **Technology එක අතින් ජපානෙ ඒ කාලෙයි, අදයි අතර වෙනස කොහොමද දකින්නෙ?**

ඒ කාලෙ ජපානෙ ටෙක්නිකලි (Technically)  හොදයි කියලා හිතන් හිටියා  දන්න මිනිස්සු. දැන් තියන ජැපනිස් කම්පැනිස් වල (Japanese companies) කලින් තිබ්බ නාමය නෑ. ඉස්සර තිබ්බ සෝනි (Sonny), පැනසොනික් (Panasonic) ග්ලෝබල් කම්පැනිස්. ඒව technology අතින් ටොප් කම්පැනීස්. දැන් ඒ වගෙ top technology තියන කම්පැනීස් නැ ජපන් රටේ. තශීමා ඉලෙක්ට්‍රොනික් (Tashima Electronic) ඒ වගේ. ටොයොටා විතරයි තියන්නෙ මිනිස්සුන්ට දැනගන්න.

අනිත් කම්පැනීස්වලට එච්චර respect එකක් නැ දැන් ලෝකේ. ඒක නිසා සාමාන්‍යයෙන් ජපන් කිව්වම මම නම් හිතන්නෙ ඉස්සර තිබ්ච්ච තැන නැ දැන්. මම හිතන්නෙ Education තමයි ඒකට හේතුව වෙලා තියන්නෙ. අනිත් එක ජැපනිස් කොමපැනීස්වලින් හයර් (hire) කරන විදිය. එක සැරයක් මම රිසර්ච් එකක් කරා අයි.ටී. කොම්පැනීස් (IT companies) හයර් කරන්නෙ  කොයි වගෙ අය ද කියලා.  දැන් foreigners හයර් කරනවා නම් මූලිකම qualification එක මොකද්ද? IT නෙවෙයි ජැපනිස් (Japanese). (සිනාසි) ඉතින් ජැපනිස් ඉගෙන ගන්නවද IT දන්න කෙනෙක් ජපන් රටට ඇවිත්. නැනෙ. IT දන්නෙ නැති අය තමයි ජපන් ඉගෙනගෙන ජපන් රටට එන්නෙ. ඉතින් අන්න ඒ වගෙ අය හයර් කරන්න පටන් ගත්තා ජැපනිස් කම්පැනිස්. ඒකයි ජැපනීස් කොම්පැනීස්වල (Japanese companies)  ලෙවල් එක බැස්ස හේතුව. අනිත් එක  ඒ IT ජැපනිස් අය එක එක අය හයර් කරන්නෙ නැ ජැපනිස්ල ම. ඒක නිසා හුගක් companies වල IT technology  පැත්ත නැ එච්චර. එක පැත්තක් තියනවා ඉලෙක්ට්‍රිකල් ඉංජිනීයරින් (Electrical Engineering), මැකැනිකල් ඉංජිනීයරින්ග් (Mechanical Engineering) අන්න ඒ පැත්ත. ඒ පැත්ත හොඳයි. අනිත් ඒවා සොෆ්ට්වෙයාර් (Software) අතින් ඒගොල්ලො හරියට කර ගත්තෙ නැ . ඒ නිසා කවුරුත්  consumer electronic වලින් ජැපනීස් කොම්පැනි (Japanese companies) නෑ දැන් පිටරටවල. ටොයෝටා විතරයි තියන එක ම company එක මම නම් හිතන්නෙ. මම ඉතින් යනවා කැම්පස් එකේ එක එක ඉවෙන්ට්ස්වලට. පිටරට ගියහම අහනවා මිනිස්සු. "ප්‍රොෆෙසර්, අපි බලනකොට තියන්නෙ කොරියන් companies, නැත්තං චයිනීස්. ඉතින් ජපන් රටට ගිහින් ඉගෙන ගන්න එකේ තියන වාසිය මොකද්ද?" කියලා අහනවා ළමයි. ඉතින් අපිට ඒවට හොඳ උත්තර දෙන්න ටිකක් අමාරුයි.

ඉතින් Japanese education system එකේන් තමයි ඒක හදාගෙන තියන්නෙ. Education and hire impact එක Japanese companies වල. මම අඳුරන අය ඉන්නවා ටෝකියෝවල. ඒ අය කියලා තියනවා මට "ප්‍රොෆෙසර්, ජපන්වලට වෙලා තියන ලොකුම ප්‍රශ්නෙ HR people කියලා. HR people හයර් කරන අය ඒගොල්ලො කතා කරන්නෙ නෑ ඉංග්‍රීසි. ඒකයි ඒගොල්ලො අහන්නෙ Japanese කතා කරන්න පුලුවන් ද කියලා. ජැපනිස් කම්පැනිවල තියන තවත් එක practice එකක් තමයි තියන skill එකට නෙවෙයි හයර් කරන්නේ. එක්කෝ ඒගොල්ලො ඉස්කෝලෙ නමට හයර් කරනවා, අනිත් එක මොකක් හරි general විදියට හයර් කරනවා. ඉතින් ඒක නිසා ගොඩක් කොම්පැනීස් IT අය හයර් කරලා නෑ. ඉතින් ඒකයි ප්‍රශ්නෙ වෙලා තියන්නෙ. හොඳ ස්මාර්ට් ජැපනීස් ස්ටුඩන්ට්ස්ලා IT කළේ නෑ. මොකද හයර් කරන්නෙ නෑනෙ. හයර් කරන්නෙ නැත්තං මොකටද ඉගෙන ගන්නෙ කියලා ඒ අය ඉගෙන ගත්තෙ නෑ. දැන් ජපන් රටේ නෑ IT දන්න අය. ඒක තමයි ලොකු ම ප්‍රශ්නෙ වෙලා තියන්නෙ. මම එක පත්තරේක මේ ලඟදි කියෙව්වා "Toyota wants to hire 18000 AI engineers" කියලා. They don't have' ඒගොල්ලොන්ට දාහක්වත් හොයාගන්න බෑ ජපන් රටේ. මොකද ඒගොල්ලො කරෙ නෑ IT. ඒක දැන් ලොකු ප්‍රශ්නයක් වෙලා තියනවා. ඒකයි ජපන් රටේ තත්ත්වය.

- **ජීවිතයේ අමතක නොවන සිදුවීමක් තියනවා ද කියන්න**

අමතක නොවන සිදුවීම් ගොඩක් තියෙනවා. එකක් කියලා එකක් කියන්න අමාරුයි. මට පොඩි කාලේ ඉඳන් බැලුවොත් ආච්චි අම්මත් එක්ක ඉස්කෝලෙ ගියපු කතා, ඇමෙරිකාවට ගිහිල්ලා ආපහු එන්න හැදුව කතා, ඊටපස්සෙ Bell labs වල ජොබ් එක හම්බුන කතා, මම ජපන් රටට ආපු කතා, මම ජපන් රටේ ඉන්න තීරණය කරපු කතා, ඒ ඔක්කොම මට මතකයි.

- **ජීවිතයේ හැරවුම් ලක්ෂයක් (Turning point) කිව්වොත්?**

ජීවිතයෙ ටර්නින් පොයින්ට් එකක් තියෙන තැනක් කිව්වොත් මට ආයෙ කියන්න පුළුවන් fiber optics කතාව තමයි. මොකද ඒ කතාවෙන් මට චාන්ස් එකක් උදා වුණා. අනිත් එක මගේ communication skills, මිනිස්සුන්ට කතා කරන්න ඒක මට උදව් වෙලා තියෙනවා.

- **ගොඩක් ජයග්‍රහණ ලබාගෙන ගොඩක් අමාරු ගමනක් ඇවිත් තියෙනවා. හැම අවස්ථාවක දී ම මුහුණ දුන් බාධක කොයි වගේ ද? බාධක අනිවාර්යයෙන් එන්න ඇති.**

බාධක අපි කොහේ ගියත් තියෙනවා.කොයි රටේ හිටියත් බාධක තියෙනවා, ලංකාවේ හිටියත් බාධක තියෙනවා. බාධක නැති තැනක් නෑ මේ ලෝකෙ කොහෙවත්. කොහොම හරි මගැරගෙන ඉන්න එක තමයි වටිනාකම. බාධක කියන දේ තියෙනවා. දැනුත් තියෙනවා. අපිට හිතෙන හිතෙන දේ, කරන්න ඕනි දේ කරන්න බෑ. ඉතින් කොහේ ගියත් බාධක තියෙනවා.

- **Digital business කියන ෆිල්ඩ් (Field) එකෙන් ඉස්සරහට එන්න බලාගෙන ඉන්න studentsලාට opportunities ජපානෙ හරි පිටරටවල හරි තියෙනවා ද?**

ජපානය අර ප්‍රොබ්ලම් (Problem) තමයි තියන්නෙ. ඩිජිටල් බිස්නස් (Digital business) අනිත් කොම්පැනිවලිස්වලින් හයර් කරන්නේ නැහැ ඩිජිටල් බිස්නස් කරන අය. දැන් ඉතින් බලනවා හොයන්න, හැබැයි හොයාගන්න නැහැ. ඒක නිසා හැබැයි චාන්ස් (Chance) එකක් තියෙනවා හොඳ ස්මාර්ට් (Smart) අය ආවොත් ලංකාවෙන් මෙහේ.

- **ඇකඩමික් (Academic) සහ ප්‍රොෆෙෂනල් (Professional) දෙකෙන්ම ?**

Yeah. මම කිව්වේ ටොයොටාවලට (Toyota) 18,000ක් හොයනවා කියලා. පොඩ්ඩක් ජැපනිස් කතා කරගන්න පුලුවන් නම් ජැපනීස් තියනවනම් හොඳ ජොබ්ස් හොයාගන්න පුළුවන්.

- **ඔබතුමා Extra- curricular activities පිළිබඳ ව ලොකු කැමැත්තක් තියෙනවා කියලා දැනගන්න ලැබුණා. ෆැෂන් ඩිසයිනින්ග්වලට (Fashion design) විශේෂයෙන් ම. ඔබට Awards ලැබිලා තියෙනවා. ඒ ගැනත් පොඩ්ඩක් මතක් කරමු.**

කොහොම හරි මට ආර්ට් කියන දේ පුළුවන් පොඩි කාලේ ඉඳන් ම. එක පාරක් මට මතකයි ටීචර් කෙනෙක් කිව්වා මට කවුරු හරි වෙන්න, වැඩක් කරගන්න බැරි ම වුණොත් අඩු ම ගාණේ ආටිස්ට් කෙනෙක් හරි වෙන්න පුළුවන් කියලා. මට ඒක තාම මතකයි. ඊට පස්සේ මම ඒක ගෙදර ගිහින් කිව්ව ම මගේ ආන්ටි කිව්වා, "අනේ, අනේ ආර්ටිස්ට් කෙනෙක් වෙලා සල්ලි හොයා ගන්න බෑ. ආර්ටිස්ට් කෙනෙක් වෙන්න එපා" කියලා.

ඉතින් කොහොම හරි මම ආටිස්ට් පැත්ත අතහැරලා දාලා මම ඉතින් අනිත් පැත්තට බැලුවා. කොහොම හරි ඉතින් ඒ වුනාට ආර්ට් අඳින ආසාව මට තිබුණා. කොහොමත් මම ප්‍රොෆෙෂනල් විදිහට පුරුදු වුණේ නැතත් ඒ වගේ වැඩ මම කරා. ආර්ටිස් වැඩ. ඉතින් ඒවගෙන් මට එක එක අවො(ර්)ඩ්ස් (Awards) හම්බෙලා තියෙනවා. මගේ එක්සිබිෂන් එකක් තිබිලා තියෙනවා මේ මෙට්රොපොලිටන් මියුසියම් එකේ ටෝකියොවල තියන. ඒ වගේ ම ආර්ට්ස් එක්ශිබිට් (Exhibit) කරලා තියනවා. ඉතින් ඒ වගෙ වැඩ කරලා තියනවා. අන්න ඒ වගෙ තමයි ෆැශන් ඩිසයිනින්ග්වලටත් වුණේ. මගෙ හිටියා සිස්ට(ර්)ගේ (Sister's) පුතෙක්. එයා ඇවිල්ලා හිටියා මෙහෙ මාත් එක්ක. පොඩ්ඩක් ඉගෙන ගන්න ඕනේ කියලා එක එක දේවල් කැම්පස් එකට යන්න. ඇවිල්ල ඉතින් ගෙදර ඉන්න ගමන් computer එක අත ගහගෙන ඉන්නවා, ටීවී බල බලා ඉන්නවා. මම කිව්වා ඉතින් අනම් මනම් කරන්නැතුව මොකක් හරි ඩිසයින් (design) වැඩක් හරි කරන්න කියලා computer එකෙන්. එයා කොහොම හරි ඩිසයිනින්ග් සොෆ්ට්වෙයාර් (Design software) එකක් හොයාගෙන හැදුව එක එක දේවල්. එහෙම ඉද්දි මටත් හිතුනා, " මේක හොඳයිනේ", මාත් ඩිසයිනින්ග් (Designing) කරා. දෙන්නම එකතු වෙලා. ඉතින් ඒ මාර්ගයෙන් තමයි පස්සේ මම හිතුවා මොකක් හරි ඉටැලියන් (Italy) නමක් තියනවා නම් හොඳයිනෙ කියලා. පස්සේ මම ඉටැලිවලට ගිහින් කාලයක් ඉගෙනගත්තා fashion designing. ඊට පස්සේ fashion designing business එකක් පටන් ගත්තා. ඒකට හුඟක් වෙලාවට වෙලාව කැප කරන්න ඕනේ. ඉතින් මට කැප කරන්න එච්චර වෙලාව නැති නිසා මම ඒක අත්හැරලා දැම්මා. ඒ වුනාට මගේ nephew ඒක දිගට ම අල්ලගෙන තිබ්බා. ඊට පස්සේ එයා ඇමරිකාවේ ඉස්කෝලෙකට ගිහිල්ලා එහි වැඩ කරනවා එයාගෙ ම කම්පැනි එකක් set up කරලා. ඒක ගොඩක් හොඳයි. ඒ company එකේ හැට දෙනෙක් විතර වැඩ කරනවා. අන්න ඒ වගේ වැඩ මම කරනවා Extra-curricular විදියට, Designing වැඩයි, Movies බලනවා පෙළක් වෙලාවට. ඒ වගේ හොඳ හොඳ වැඩ ඉතින් stress එක යන්නයි නිකන් මගේ hobby එක වගෙයි.

- **අනාගත බලාපොරොත්තු මොනවද තියෙන්නේ රිසර්ච් ෆිල්ඩ් එකෙන් හරි අනෙකුත් ෆිල්ඩ් එකකින් හරි ප්ලෑන් කරලා තියෙනවද?**

අනාගතය කියන ඒවා ඉතින් එක එක අදහස් තියෙනවා. රිසර්ච්වලින් (Research) ම කරන්න කියලා හිතනවා. ඒ වගේ එක එක අදහස් තියෙනවා ගොඩක්. මේ, ... මට දැන් හිතෙනවා මේක කරදරයක් කියලා. ඒක නිසා මම බලනවා අනාගතයේ කරන්න වෙන මොකක් හරි දෙයක්.

- **අවසාන වශයෙන් මං කැමති ඔබතුමාගෙන් අහන්න, දැන් ලංකාවේ ගොඩක් අය ජපානයට එන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ලංකාවේ තියෙන සිටුවේෂන් (Situation) එකත් එක්ක. ඒ අය වෙනුවෙන් ඒ අය දිරිගන්වන්න කියන්න තියෙන්නේ මොනවද?**

ජපානයට එන්න හරි ජපන් රටේ වැඩ කරන්න හරි හිතාගෙන ඉන්නවනම් කෙනෙක්ට මගේ එක ම suggestion එක, ලොකු ම දේ ජපන් ටිකක් ඉගෙන ගන්න කියන එක. Japanese ඉගෙන ගත්තේ නැත්නම් ජපන් රටට ඇවිල්ලා මොනව හරි දෙයක් කරන්න හරි අමාරුයි. ජපන් ඉගෙන ගන්න ජපන් ඉස්කෝලවලට ම යන්න ඕන නැහැ. නිකන් කතා කරලා මිනිස්සුත් එක්ක ඉගෙන ගන්න පුලුවන්. දැන් මම කියනවා හැමෝට ම ජපන් ඉගෙන ගන්න Mobile phones එහෙම තියෙනවා හැමෝට ම, මං කියනවා ඇප්ලිකේෂන්ස් (Applications) තුනයි ඕනි ජපන් ඉගෙන ගන්න. මේ Applications තුන තියෙනවා නම් ලංකාව නෙවෙයි, ලෝකෙ කොහේ ඉඳන් වුණාත් ජපන් ඉගෙන ගන්න පුළුවන්. ඒකට ඉතින් ටිකක් self-discipline තියෙනවනම් Japanese ඉගෙනගන්න පුළුවන්. මම ඕනෙනම් ඒ Applications තුනේ නම් කියන්නම්. ලංකාවේ අයටත් ඒ තුන download කරලා ඉගෙන ගන්න පුළුවන්. එකක් තමයි NHK Rajio කියන්නෙ NHK Radio, ඇපල් ස්ටෝ (Apple store), හරි ගූගල් (Google) හරි search කරා ම තියෙනවා ඒ ඇප් එක. ඒ ඇප් එකේ ඉන්නකොට Japan program නොමිලේ අහන්න පුළුවන්. ඒවා අහන්න ඉස්සෙල්ල ම. තේරුනේ නැතත් කමක් නෑ අහන්න. එතකොට කන පුරුදු වෙනවා භාෂාවට. දැන් පොඩි ළමයි කාගෙන්වත් හරි ඉස්කෝලෙකින්වත් ඉගෙන ගන්නව නෙවෙයිනෙ කතා කරන්නේ. අනිත් අය කතා කරන දේවල් බලාගෙනනෙ ඉගෙනගන්නේ. ඒ වගේ අපිටත් කරන්න පුළුවන්. අනිත් එක තමයි IMIWA කියලා තව ඇප් (App) එකක් තියනවා. මේ IMIWA Application එකෙන් පුළුවන් රේඩියෝ එකෙන් අහල තේරෙන්නේ නැති වචනයක් තියෙනවා නම් මේක ලියාගෙන මේකට දාගෙන ඉංග්‍රීසින් හරි සිංහලෙන් හරි කමක් නෑ මේකෙ අදහස හොයාගන්න පුළුවන්. මොකක්ද මේකෙ අදහස කියලා. ලියන විදිහ, කංජි එහෙම. දැන් ඒක දාපුවහ ම IMIWA කියන එකේ තියෙනවා ඒක use කරන විදිය. එක එක Example sentences, Examples වගෙ දේවල් තියනවා. Examples අරගෙන google එකට දාපුවහම ඒකෙන් අදහස් කරන දේ තියෙනවා ගුගල් එකේ. ඉතින් අනිත් එක ගුගල් ට්‍රාන්ස්ලේට් (Google translate) එක තමයි අනිත් ඇප් එක.

App තුන තියෙනවා නම් ජපන් භාෂාව ඉගෙන ගන්න පුළුවන් කිසි ඉස්කෝලයක ඉගෙන ගන්නේ නැතුව. ඒක මම recommend කරනවා. මේක ජපන් රටට එන්න ඉස්සෙල්ලා කරන්න. මේක කරන්න මේහෙ ආවා ම නම් අනිත් අයත් එක්ක කතා කරලා ජපන් භාෂාව පුරුදු වෙන්න. නිකන් ඉස්කෝලෙකට ගියා කියලා ජපන් භාෂාව පුරුදු වෙන්න බෑ. එච්ච හොඳ exams pass වෙන්න. දැන් කම්පැනීස්වලට IT තියෙනවා නම් ජපන් භාෂාව ඕනේ නෑ. කතා කරන්න පුළුවන් නම් අර HR man එක්ක ජැපනිස්වලින් ජොබ්ස් තියනවා ඉතින් ඇත්තට ම ජපන් රටේ. ජපන් රට Economically එච්චර Attractive නැහැ. අනිත් රටවල් එක්ක බැලුවොත්, සමහර පිටරටවල් එක්ක බැලුවොත්, ජපන් රටේ ලොකුම Attraction එක මට නම්, ජපන් රටේ ඉන්න මිනිස්සු. ජපන් රටේ ඉන්න මිනිස්සු හරි නිහතමානි. ඒගොල්ලො වංචා කරන්නෙ නැ. අනිත් අයට උදව් කරන්න කැමතියි. ඉතින් ඒ වගෙ දේවල් ඉගෙන ගන්න පුලුවන් ලංකාවෙ අයට. එහෙම මොනවා හරි ඉගෙන ගෙන ලංකාවටත් continue කරන්න පුලුවන් නම් අන්න ඒක තමයි ලොකුම උදව්ව කියලා මං හිතන විදියට. ලංකාවේ ඉන්න හොරු හැටියට බලපුහම. ජපන් රටේ මිනිස්සු අන්න ඒ අතින්. ඉගෙන ගන්න ඒ මිනිස්සුන්ගෙන්. Politicians ඒ හැමෝ්ට ම. ලංකාවේ කරන්ඩ පුලුවන් මොකක් හරි power එකක් තියන මිනිස්සු වුනහම ඒගොල්ලොන්ගේ මම කියන්නේ "ඔලුව ඉදිමෙනවා" කියලා ලොකු ලෙඩක් හැදෙනවා ලංකාවේ මිනිස්සුන්ට. ඒ ලෙඩේ නැ ජපන් අයට. අන්න ඒ ලෙඩේ නොගන්නෙ කොහොමද කියලා ඉගෙන ගන්න පුලුවන් ජපන් රටට ආවොත්. ලංකාවේ මිනිස්සුන්ට තියනවා ඔය වගේ කාර් පිස්සුව. මම හොද කතාවක් අහන්න ඕනි නම් කියන්නම්. "මම බිස්නස් වැඩකට කොළඹ ගියා. සිනමන්ඩ් ග්‍රෑන්ඩ් හොටෙල් එකේ දැන් මම ඉන්නවා. කොහොමහරි දවස් දහයක් විතර හිටියා. ඉතින් කොහොම හරි ඒ අතරෙන් මගේ cousin කෙනෙක් එයා ඉංජිනියර් (Engineer) කෙනෙක්. එයා ඉතින් තමන්ගේ මහන්සියෙන් වැඩ කරලා සල්ලි හම්බ කරලා, කොළඹ ලොකු buildings හදලා තියන්නෙ එයත් එක්ක ඉන්න කම්පැනිය. අනිත් එක foreign රටවල අය මෙහෙ big project කරනවා. ඉතින් කොහොම හරි එයා ආවා මාව බලන්න. Dinner එක ගන්න එයාගෙ family එකත් එක්ක. ඉතින් ඒ ආපු කාර් එක කොහොමහරි ඒක දැක්කාම සාමාන්‍යයෙන් හිතෙනවා මේක ලංකාවේ සල්ලිකාර කෙනෙක්ගෙ වෙන්න ඇති කියලා. ගාර්ඩ්ලා ඔක්කොමලා දැක්කා මෙයා ආවේ මාව හම්බෙන්න කියලා. ඉතින් එයා ගියාට පස්සෙ ගාඩ්ලා ඔක්කොමලා මට සැලියුට් කරන්න පටන් ගත්තා.

ඊට ඉස්සරින් දවස් කීපයක් මං හිටියා කවුරුත් බැලුවෙත් නෑ මම දිහා. අරයා අර කාර් එකේ ආව නිසා එයා කොහොම හරි ලොකු මිනිහෙක් කියලා හිතන්න ඇති. ඒ මිනිහා මේ ගොයියා බලන්න ආවා කියලා හිතලා මට සැලියුට් කරන්න පටන් ගත්තා ඊටපස්සෙ. දකින කොට අනිත් කෙළවරේ ඉන්න මිනිහත් මට සැලුයුට් කරනවා. අන්න ඒ වගේ mentality එකක් තියෙන්නෙ ලංකාවේ. ජපන් රටේ එහෙම එකක් නෑනෙ. අන්න ඒ දේ තමයි ඉගෙනගන්න තියෙන ලොකු ම දේ ජපන් රටේ මම නම් කියන්නේ (සිනාසෙමින්). ඒක මට හොඳට මතකයි. ඒක මට කොහොමත් අමතක නොවන සිද්ධියක්. ඊට කලින් මම දිහා බලුවෙවත් නෑ කවුරුත්. Top to bottom. Unbelievable.

- **SLSAJ වෙනුවෙන් පණිවිඩයක් හරි සුභ පැතුමක් හරි තියෙනවනම් ඔබට අවස්ථාව.**

මට මේ අවස්ථාව ලබා දුන්නට මම බොහොම ස්තුතිවන්ත වෙනවා. ඔයාලට තියෙනවා හොඳට contribute කරන්න පුළුවන් දේවල් ලංකාවේ හැටියට. මම දෙන මැසේජ් එක තමයි Japanese ඉගෙන ගන්න පොඩ්ඩක් කියන එක හැමෝ්ට ම. Text book Japanese නෙවෙයි, ජපන් අයත් එක්ක කතා කරන්න පුළුවන් වෙන. ජැපනීස් කිව්ව ම ඉංග්‍රීසි කතා නොකරන අය තමා හොඳ ම අය. මොකද ඒගොල්ලන්ට කතා කරන්න පුළුවන් ජපන් විතරයිනේ. එතකොට ඔයාට ජැපන්ස් කතා කරන්න වෙනවා ඒ අයත් එක්ක communicate කරනකොට. අන්න ඒක නිසා එක එක වැඩ කරන අය, cleaning කරන අය, උයන අය, කඩවල වැඩ කරන අය, අන්න ඒ අය හරි ම වටිනවා ගොඩක් Japanese ඉගෙන ගන්න. ඒ අයත් එක්ක කතා කරන්න ලැබෙන චාන්ස් එක මගහැර ගන්න එපැයි කියන දේ මතක් කරනවා ඔක්කොටම. මොනවා ම හරි ඇකඩමින් වැඩක් කරන්න තියෙනවා නම් මටත් මොනවා හරි තියෙනවා නම් කියන්න. මම හැමවෙලේ ම ප්‍රාර්ථනා කරනවා ලංකාවේ ඉන්න ළමයින්ට සාර්ථක වෙන්න කියලා. ජපන් රටට ඇවිත් ඉගෙන ගන්න. අපේ කැම්පස් එකේත් ඉන්නවා පනහක් හැටක් ලංකාවේ අය. පෙළක් අය ලංකාවේ ගතිගුණ ම තියාගෙන ඉන්නවා, පෙළක් අය වෙනස් වෙනවා. ඒ වෙනස්වීම අවශ්‍යයි කියලා මටත් හිතෙනවා. එහෙම වෙනස් වෙන්න බැරි අයට එන්න එපායි කියලා මමත් කියනවා ජපන් රටට. ඒ මැසේජ් එකත් එක්ක ඔක්කොටමත්, ඔයාටත් මම සුභ පතනවා සාර්ථක වේවා කියලා. ගුඩ් ලක්!

**බොහොම ස්තුතියි සර්!**

# සේයා රූ





**Mt. Fuji from sky**
Kasun Thalgaskotuwa



**Sky tree**
Pramodhya Dissanayaka

**Perspective**
Pramodhya Dissanayaka





**Tokyo tower**
Pramodhya Dissanayaka



**Standing strong**
Pramodhya Dissanayaka



**Winter**
Pramodhya Dissanayaka

**City lights**
Pramodhya Dissanayaka





**Winter in IUJ**
Sachithra de Alwis




**Beauty of Winter**
Pramodhya Dissanayaka



**A new Adventure**
Pramodhya Dissanayaka


## Winter
Pramodhya Dissanayaka






## A long journey
Sachithra de Alwis

# කැටපත් පවුර



# සඳට හිමි රැය



අඳුරු අහස සොඳුරු  කරන් එළිය හලන්නට
පරක්කු වී ඇහැරුණු සඳ දිව එන්නට පෙර
අහස වසා රුව සරසා තරු එකිනෙක ගෙන
අමුණමි නෙක රටා මවා සඳ වට තනියට...

එබිකම් කර රුව විදින්ට සඳ තරු දගලන
නෙලුම් හැකිල ඉඩ දුන්නයි වැව් දිය කැඩපත
නෙලුම් පතක නටන්න තහනම් දිය බිඳුවට
එපා සුළඟ දිය කලතන්නට නැහැ අවසර...

ලොවටම රහසින් අහසින් වැසුණු විමන් වල
නටනවාලු සුරංගනාවන් පොළොවට බැස
නොදුටිමි රෑ සිරි මුත් සිත ඇදි ලෙස වෙර ගෙන
කවියක් කර ලියා තබමි කොද මල් පෙත්තක...

කේ.ජී. ශෂිකා සංජීවනී කෝරළගේ

# පාලු වූ රජදහන

හීනියට පොල් අතු රටා මතුකර
අම්මා අමදින ගෙමිදුල
වේලිච්ච කොළ වැටී හැඩිවී
ඉදලෙ පහසම සොයා ලතැවෙන..

මල් වැරුවෙ තරහටද අඹගස
මල් පදුරු වල් පදුරු මැදින් සැගවී ගිය
දීග ගිය අක්කා නැති සොවින් වැළපෙන
වතුසුද්ද ගස තාමත් මල් උපද්දන..

අමතකව වළදක බර
ගිනි උණුසුමක් නොලැබුව
තැවේ දර ලිපද අලසව..
ඔරලෝසු බට්ටා දෙබෑ කරයි නිහඬබව.
මකුළුවන් හට උරුම අපේ රජදහනේ පැතිරුණ..

දකිමි පෙර ලෙසම රජ කරන හාන්සි පුටුව..
දිගැදි අප්පච්චි කවි කතා කියා අප සැනසුව
අම්බිලි මාමාට කිරිපැණි ගේන්නට
කරපු කරදර තාම මට මතකය...

සොය සොයා අතීතෙක සුවද
සිත දුවයි වියළී නෙත් තෙත් කර
පාලුවද තනිකමද පාරවන හදවත..
විදිමි තනියම කාලයට රවමින...

කේ.ජී. ශෂිකා සංජීවනී කෝරළගෙ
*International University of Japan,*
*Minamiuonuma City, Niigata*





# අලුත් අවුරුද්දේ අසිරිය


By: Ishara Opatha
Hiroshima University

දසත රැව්දෙන රන්න ගී සුරලින්
ඇසෙන ඔන්චිලි වාරම් සද්දදන්
කැවුම් කිරිබත් සුවද මන බදිමින්
ඇලී යයි පෙතම නවසිරියෙන්

පෙරදිගින් නැදගන හිරු කිරණින්
දස අතින් පිපෙන මල් කැ කුළින්
රැව් දෙමින් කොවුල් ගී නදින්
ගම් මැදින් අවුරුද්ද ඇවිදින්

නැවුම් රෙදිපිළි හැඩ දමා අදිමින්
බත බුලත් ගෙන නෑ ගමන් පෙරමන්
බුලත් හුරුලෙන් පිදුම් දී බැතියෙන්
අලුත් අවුරුදු උදාවේ සැමරුම්

පිපෙන එරබදු මල් කිණිති අතරින්
හමන මදනල හද මඩල සිබිමින්
නැවුම් සිතිවිලි හදපුරා නැගෙමින්
සැවොම එක්වෙති නව වසරේ සතුටින්



දිනුම සදන- නව දැනුම සොයාගෙන
සරනු පතා විදූ නැණ සයුරේ
පුරුදූ ඉසව්වෙන්-දූරක ඉගිලවිත්
ලගුම් ගතිමි සකුරා ඉවුරේ

වරා නින්ද සැප- දරා වෙහෙස දුක
උහුලා මං පෙත සැදූ රිදුම්
පිය මැන මම කඳු මුදුනට ආවෙමි
සපුරා දිරියෙන් පැතූ පැතුම්

තෙවස් ඇවෑමෙන්- සමුගෙන මෙබිමෙන්
අහස්තලය සිපගෙන නැගෙමි
සොම්නස ඉහිරෙන සිතිවිලි දරමින්
සුන්දර ලක්මව වෙත ඇදෙමි

*මයුර අරන්දර*

# ඉතින් අපි.....



ඉසුරුමුණි පෙම් කවක් නැති
බොරු තොදොල් ආදර වදන් නැති
බං බොලන් කියාගත හැකි
මට මං වගේ ඉදින්නට හැකි

මම කැරලෙක් ඔහු බස්සෙක් ය නිති
ඒ හින්දාම ලොකු රණ්ඩු සරුවල් නැති
මගෙ බොලදකම් ඉවසන්න හැකි
නුඹ ඉතින් මගේ පණ සේම රැකි

ආදරෙන් බලාගන්නට අප්පච්චී නැති
ඒ හින්දාම ඔහු නුඹව මට එවන්නැති
ජීවිතේ ඉතිරි දුර ගෙවන්නට හැකි
නුඹ ඉතින් මට මගෙ හුස්ම හා සරි

*අමන්දා නිශාමිණී පෙරේරා*
*National Graduate Institute for policy studies*



# මියදෙන මුන්ටාජ්

By Migara Rathnayaka

හිනහී බලා ටජ්මහලේ වහල දෙස
රජු හිනහුනා දේවියගේ පතිවතට
පෙමකට කුමට මන්දිර නැති කල සතුට
මෙය සිර ගෙයයි මම පෙම්වත් පිරුවාට...

රූ සිරු ලදිමි නොදනිමි ඒ පිනද පව
කැඩපත් පමණී දැක ඇත්තේ එසා රුව
මහදේ ලැගුම් ලූවේ රජු පමණ බව
පවසයි විසල් ටජ්මහලේ බිත්ති වුව...

හිතකට යදම් දොරගුලු පවරන්න බැරී
මන්දිර දිය අගල් හැදූ මුත් පලක් නැතී
හද බැදලන්න ඔබෙ පෙම්වත් යදම් ඇතී
බැදලනු හදින් පමණක් මා යාවී මැරී

මා මිය ගියොත් ටජ්මහලේ වහල යට
එය ගොඩ නගනු පෙම් ප්‍රාසාදයක් ලෙස
එක්ටැම කඩා දිය අගලද විලක් කොට
මට තැනවූව බව ලියවනු මගෙ මිනිය යට...

**பல தடைகள் தாண்டியே இவர்கள் சாதனைகள்**

எனது இனிய பிஞ்சு பாலகர்களாய்
மெல்ல நடந்து மெல்ல எழுந்து
சிறுக மழலைமொழி பேசி
கடவுள் தன்னையே நகலெடுத்து மண்ணில்
தவழவிட்ட ஓவியர்களாய்
இவ்வையகம் தனிலே உம் வரலாறு தனை
உடன்பொறிக்க வந்தீர்களே கேளீர்

அப்பிள் உனை விஞ்ஞானி ஆக்கியதோ ஐசாக்
உலகுக்காய் வெளிச்சமளிக்க பிறந்தாயோ குறும்புகார எடி
பள்ளிதரா பாடத்தை பயில்விக்க உன் அன்னை
உனக்கு மானசீக குருவானாரே பாரீர்

சின்னஞ்சிறு அதிசயமே! பிரமன் வளர்த்த ஓவியமே!
நீவீர் சாதனை படைக்க தாண்ட வேண்டிய
சாதனைகள் ஒன்றா இரண்டா இப்பாரிதனில்



சுட்டெரிக்கும் கொடுநோய்கள் ஒருபுறம் வட்டமிட்டு
பறந்துவரும் கொடு பாதகர்கள் மறுபுறம்
கடத்தல் என்பார்கள் அங்கத்திருட்டு என்பார்கள்
ஸ்மாட் போன் என்பார்கள் ஐபார்ட் என்பார்கள்
கற்றல் என்பார்கள் கற்றல் தேர்ச்சி என்பார்கள்
அடைவுமட்டம் என்பார்கள் மேலதிகவகுப்பு என்பார்கள்

அப்பப்பா ஒன்றா இரண்டா வார்த்தைக்ள் நூறு
உங்கள் அகராதியில் புரட்டுகிறேன் தேடுகிறேன்
வாழ்க்கைப்பாதையில் முட்கள் கற்கள்
குறுகி மெதுநடக்கும் தூரம் எப்போது மாறும்

மெல்ல எழுந்து அகரம் தொட்டு
எண்கணிதமதில் ஸ்ரீனிவாச ராமானுயனாய்
காடையரை சுட்டெரிக்கும் புதுக்கவி பாரதியாய்
தொலைநோக்கு சிந்தனைகள் படைக்கவல்ல
கலிலியோவின் தொலைகாட்டிகளாய்
தடைகளை உடைத்து சரித்திரம் படைக்க
சோதனைகளை சாதனைகளாக்கி
காந்தியாக நேருவாக அன்னை தெரேசாவாக எழுவீ!
உம் சரித்திரம் படைப்பீர்

**திருமதி சிவதர்சினி ஜெயவாணன்**

# සුදු රෝස මල් වඩම්...




උසස් බාලිකා විදු මවු තුරුලේ
නන් දෙසින් පැමිණි අප
හමුවුනිය එක්තරා නැවුම් හිමිදිරි උදයක...
එදා පටන් කෙළිදෙලෙන් දහ පෑ
කිරි කවඩි සිනා පිරි සුන්දර පාසල් විය
ආවර්ජනය කරන අද දිනයේ
විසිතුන් වසකට පසු...
සතුටු කඳුලක සිරවූ
වාචා ගත නොහැකි දරා ගත නොහැකි
දුක්බර විලාපය
ඔබට ඇසේදැයි නොදනිමි සොයුරියනි...
එනමුදු පසක් කරනෙමු
ආදරේ බව අප සැමොම
ඔබ අප අතර ජීවමාන හෙයින් අදටත්...
කඳුලින් බරවූ නෙත් යුග බොඳ කර
පතනෙමු විවර වන්නට
අමයුරු නිවනේ දොරගුළු ඔබහට
සුදු රෝස මල් වඩම් පෙරටු කරගෙන
සුදු පාවඩ මතින්
අප අතරින් සඳහටම වෙන්ව ගිය
සදාදර යෙහෙළියනේ...

*By Dr. H. M. Ayala Sunali Herath*

# මියුරු ගී



ලක් පුතු වී ඉපදෙන්නට - රන් පොළවක දිවි ගෙවීමට

තරු වියනක නිදියන්නට - පුත නුඹගේ පිං ඇතිවට

ලක් පුතු වී ...

කල වේලට වැසි ලැබෙනා - ගස කොළ සරුවට වැඩෙනා

තුන් කන්නය අටු කොටු පිරෙනා - වෙනත් රටක් ලොව ඇතිනා

ලක් පුතු වී ...

ඉසුරු මුනියේ ගල් කැටයම - ඇම්බැක්කේ ලී කැටයම

කියයි පුතුට හිත ඇති වුනුදා - නෙලනු කුමක නැ මැලිකම

ලක් පුතු වී ...

පොලවේ සම්පත් රිසිසේ - රට වට මුහුදෙත් එලෙසේ

මනු සම්පත නම් නිසි රිසිසේ - සැදුනු දාට පුත රජසේ

ලක් පුතු වී ...

ගායනය : සුනෙත් කැලුම්

විශේෂ ස්තුතිය : වානි සොලංගආරච්චි

සංගීතය : සුනෙත් කැලුම්

පද රචනය : ශෂික සේනානායක

සෙන්කඩගලපුර දළදා මැදුරේ - දළදා හිමියන් වැඩ ඉන්නේ

දළදා හිමිගේ අනුහස් හින්දාද - සිරිලක නැවතත් බබලන්නේ

සෙන්කඩගලපුර ...

රත්නපුරේ සිරිපා අඩවිය තුල - සුමන සමන් දෙවි වැඩ ඉන්නේ

සුමන සමන් දෙවි පිහිට ලැබීලද - සිරිලක නැවතත් බබලන්නේ

අනුරාපුරයෙත්, පුලස්තිපුරයෙත් - ප්‍රෞඩ අතීතය පණ ලබනේ

කෙත්වතු සරුවී අටුකොටු පිරවී - පෙරදිගටම බත සපයන්නේ

විශ්වපුරය තුල ලොව දස සුපතල - පඬිවරු රැසකුත් දැන් ඉන්නේ

ලොව නන්දෙස සිට දැණුම සොයා එන - සිසු කැලගෙ නිවහන වන්නේ

ගාලු පුරේ සිට යාල් පුරයටයි - දෙපැයෙන් අධි වේගයෙ යන්නේ

හරිත වර්ණයෙන් ඔපදා සිරිලක - වන සිව්පාවුන් පිළිගන්නේ

සෙන්කඩගලපුර ...

ගායනය : ආදිත්‍යා ප්‍රභාවී වික්‍රමසිංහ

පද රචනය : ශෂික සේනානායක

සංගීතය : සුනෙත් කැලුම්


RAMADBK
RamaDBK LTD
Japanese Car Exporter
More Than 10,000 Vehicles
Choose from Cars,Vans Commercial Vehicles
36 YEARS ANNIVERSARY
ONE-STOP CAR SHOP
For All Your Vehicle Needs !
OPEN 24 HOURS
CERTIFIED
JUMVEA
横浜商工会議所
The Yokohama chamber of commerce an industry since 1880
201 Rama HQ Building, 2-1-17 Shinkoyasu,
Kanagawa -ku,Yokohama,Japan
Post Code 221-0013
Tel : +81 45 402 6117 Fax : +81 45 402 0689
www.ramadbk.com
Email : sales@ramadbk.com

*With Best Compliments from*

# GAMAETHIGE ANIL PRIYANTHA

## IMPORTERS & EXPORTERS IN ALL TYPES OF NEW AND RECONDITIONED VEHICLES, SPARE PARTS, ELECTRONIC & GENERAL ITEMS



Nipara International Co.
2356-1, Kimagase, Nodashi, Chibaken, Japan.
Post Box 270-0222.
Tel : 0081-471-98-8881
Fax : 0081-471-98-8884
Email : nipara29@galaxy.ocn.ne.jp

Yasiku International Co. Ltd.
4780-1, Kimagase, Nodashi,
Chibaken. 270-0222. Japan.
Tel : 0081-471-38-6647
FAX : 0081-471-38-6648
Email : YasikuInternational@ace.ocn.ne.jp



Sri Lanka Students' Association in Japan (SLSAJ) 2023